# කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -2023

## 01. <u>හැඳින්වීම</u>

.



- ❖ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ
- ❖ භූමි ප්‍රමාණය - වර්ග කිලෝ මීටර 17.5
- ❖ ග්‍රාම නිලධාරි වසම් ගණන - 35
- ❖ මැතිවරණ කොට්ඨාස - 02
- ❖ මුළු ජනගහනය - 406372
- • *ස්ත්‍රී ජනගහනය* - 213269
- • *පුරුෂ ජනගහනය* - 193103
- ❖ පවුල් සංඛ්‍යාව - 102541
- ❖ ඡන්ද බලය හිමි ජනගහනය - 229205




## 1.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටීම


ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ පිහිටා ඇති කොළඹ දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර 642 ක්වූ දිවයිනේ කුඩාම දිස්ත්‍රික්කය වුවද වැඩිම ජන සනත්වයක් සහිත වාණිජ දිස්ත්‍රික්කයයි. කොළඹ දිස්ත්‍රික්කය පරිපාලන පහසුව සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 කට ද, ග්‍රාම නිලධාරි වසම් 557 කට සහ ඡන්ද කොට්ඨාස 13 කටද බෙදා වෙන් කර ඇත. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් විවිධත්වයෙන් හා අධි ජනාකීර්ණ වූ කොට්ඨාසයක් ලෙස කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දැක්වීමට පුළුවනි.

කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උතුරින් කැළණි ගඟෙන් ද, දකුණින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, බටහිරින් මහ මුහුදෙන් ද නැගෙනහිරින් කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, වටවූ වර්ග කිලෝ මීටර 17.5 ක් වූ භූමි ප්‍රදේශයකින් යුක්ත වේ. කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වසම් 35 කින් ද සමන්විත වේ.

මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඓතිහාසික ස්මාරකයන්, යටත් විජිත සමයේ වූ ගෘහ නිර්මාණ ශිල්පයන් පිළිබිඹු වන ගොඩනගිලි, මුහුදු තීරයන්, භෝජනාගාර සහ විවිධ රජයේ ආයතනවල මූලස්ථාන ද පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ අගනගරය වන කොළඹ නගරයේ බොහෝ ප්‍රදේශ අඩංගු වන්නේ මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයටයි. ලක්ෂ 4ක පමණ ජනගහනයකට වාසස්ථාන සපයන අතර දෛනික පාවෙන ජනගහනය පමණක් 500,000 කට ආසන්න වේ.



## 1.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සම්පත් පසුබිම

බස්නාහිර පළාතට අයත් කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අනිත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් සුවිශේෂි ස්ථානයක් හිමි කරගන්නා ප්‍රාදේශීය ලේකම්කාර්යාලයක් වේ. ලංකාවේ වානිජ අග නගරය වන කොළඹ නගරයේ පිහිටිම ඊට හේතුව වේ.

කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උතුරින් කැළණි ගඟෙන් ද, දකුණින් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, බටහිරින් මහ මුහුදෙන් ද, නැඟෙනහිරින් කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, වටවූ වූ භූමි ප්‍රදේශයකින් යුක්ත වන අතර භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 17. 5 කි.

කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සංචාරක උරුමයන් අතින් ප්‍රධාන ස්ථානයක් ගන්නා පුරවරයක් හා සංචාරක කලාපයක් වේ. මනරම් ස්ථාන හා පුරා විද්‍යාත්මක නටබුන්, ස්මාරක , බෙහෙවින් දක්නට ලැබෙන නගරයකි. එහිදි විශේෂයෙන් සංචාරක වැදගත්කමක් ඇති ඓතිහාසික ස්ථාන කිහිපයක් මෙලෙස දැක්විය හැක.

### ගෝල් ෆේස් හෙවත් ගාලු මුවදොර



අපේ රටේ කොළඹ යැයි කියූ පමණින්ම අපට අද සිහිවන්නේ මුළු කොළඹම ලෝකයා හමුවේ තැබූ ඒ ගාලු මුවදොර පිටියයි. එසේත් නැත්නම් අපි හොඳින්ම දන්නා හඳුනන ගෝල්ෆේස් පිටියයි. ගෝල්ෆේස් පිටියට ඉතා දිගු අපූරු ඉතිහාසයක් තිබේ. එය අතීතය තුළ තුරඟ තරඟ පිටියක් ලෙසින් භාවිත කළ බව අදටත් ප්‍රසිද්ධ වූ රහසකි. එමෙන්ම ගාලුමුවදොර වරෙක වධකාගාරයක්ද විය. ඊට හේතුව එම පිටියේ ඉංග්‍රීසි හමුදාවේ යුද සෙබළකු එල්ලා මරා දැමීමට ඉදිකළ එල්ලුම් ගසයි. එමෙන්ම එදා සමාජයේ ඉහළ පැලැන්තියේ සිටි මිනිසුන් ගාලුමුවදොර නැත්නම් ගෝල්ෆේස් පිටිය තමන්ගේ ව්‍යායාම් කටයුතු සඳහාද යොදාගත් බව සඳහන් වෙයි. තවද අද මෙන්ම එදාද මේ ගාලුමුවදොර යනු සංචාරකයන්ගේ අපූරු පාරාදීසයකි. මේ අතර තවත් සුවිශේෂී හේතුවක් නිසාවෙන්ද ගාලුමුවදොර පිටිය අපට වැදගත්ය. එනම් මැයි පළමු වැනිදාට යෙදෙන ලෝකයම සමරන ජාත්‍යන්තර කම්කරු දිනය නිසාය. ඒ අනුව එදා ලංකා ඉතිහාසයේ කළ පළමු මැයි රැලියූ 1933 වර්ෂයේදී කොළඹ ප්‍රයිස් පිටියෙන් ආරම්භ වූ අතර එය අවසන් කර තිබෙන්නේ ගාලුමුවදොර පිටියෙනි. එය ලංකා ඉතිහාසයේ සිදු වූ ඉතා වැදගත්ම සිදුවීමක් ලෙස සඳහන් කළ හැකිය.

## ගංගාරාම විහාරස්ථානය




ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පයට අමතරව, ඉන්දියානු, තායිලන්ත හා චීන යන රටවල වාස්තු ලක්ෂණද දක්නට ලැබෙන කොළඹ පිහිටි ගංගාරාම විහාරය නගරයේ වූ වැදගත් බෞද්ධ පුදබිමක් වේ. විහාරයේ වාස්තු ලක්ෂණ සැලකීමේදී ප්‍රධාන වශයෙන් ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පය කැපී පෙනුනද ඉන්දියානු, තායිලන්ත හා චීන යන රටවල වාස්තු ලක්ෂණද මෙහි දැක ගත හැකිය.

සෞම්‍ය හා රමණීය භූමියක පිහිටි මෙම විහාරයේ සමහර ඉදිකිරීම් බේරෙ වැව මතුපිටට වන්නටද ඉදිකොට තිබේ. විහාරස්ථානයේ මූලිකාංග ලෙස ත්‍රෑය (දාගැබ), බෝධිය, විහාර මන්දිරය, සීමා මාලකය සහ ධාතු මන්දිරය දැක ගත හැකියි. තවද කෞතුකාගාරයක්, පුස්තකාලයක්, තෙමහල් පිරිවෙනක්, අධ්‍යාපන ශාලාවක් සහ දාන ශාලාවක්ද විහාර භූමියේ ඉදි කොට පවතී.

විහාරයේ කැපී පෙනෙන වාස්තු ඉදි කිරීමක් වූ සීමා මාලකයේ නිර්මාණ කටයුතු සිදු කර ඇත්තේ ජෙෆ්රි බාවා විසිනි. 19 වන සියවසේ ප්‍රසිද්ධ නාවුක වෙළෙන්දෙකු වූ දොන් බැස්ටියන් (ද සිල්වා ජයසූරිය ගුණවර්ධන) මුදලි විසින් මාතර ශ්‍රී ධර්මාරාම නාහිමියන්ට විහාරස්ථානයක් ඉදිකිරීම සඳහා මෙම ඉඩම මිලට ගෙන විශාල වියදමක් දරා භූමිය සකස් කොට දාගැබ, මකර තොරණ සහ ප්‍රවිශ්ඨ දොරටුවේ සඳකඩ පහන ඉදිකරණ ලදී. විහාරයේ රෝපිත, අනුරාධපුර ශ්‍රී මහා බෝධියේ අංකුරයක් වූ බෝධීන් වහන්සේද රෝපණය කොට ඇත්තේද මෙම මුදලිතුමා විසිනි. මීට අමතරව තෙමහල් දම් සභයක් හා විහාරය වටා වැටක්ද ඔහු විසින් ඉදි කෙරිණි.

## පිටකොටුව පාවෙන වෙළඳපොළ



පිටකොටුව පාවෙන වෙළඳපොල ශ්‍රී ලංකාවේ කොළඹ අවට ප්‍රදේශයක් වන පිටකොටුවේ බැස්ටියන් මාවතේ පිහිටා ඇති අතර වෙළඳ කුටි 92කින් සමන්විත වන අතර බේරේ වැවේ බෝට්ටු මත ස්ථාපිත වෙළඳ කුටි ගණනාවක් ඇත.

පාවෙන වෙළෙඳපොළ දේශීය නිෂ්පාදන සහ දේශීය හස්ත කර්මාන්ත අලෙවි කරන සංචාරක ආකර්ෂණයක් ස්ථානයක් ලෙස හැඳින්විය හැක. නාගරික සංවර්ධන අධිකාරිය මගින් පාවෙන වෙළෙඳපොළ සංවර්ධනය සහ අලංකරණ කටයුතු රු. මිලියන 150 කි. ශ්‍රී ලංකා යුද හමුදාවේ ඉංජිනේරු ඒකක නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ සහ කොළඹ කොටුව දුම්රිය ස්ථානය යා කරන වීදිය වන බැස්ටියන් වීදිය හරිත පරිසරයක් බවට පත් කරන ලදී. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් බැස්ටියන් වීදිය අසලින් දිවෙන දූෂිත ඇළ ප්‍රතිසංස්කරණය කරන ලදී. තුෂාරි කාරියවසම් විසින් නිර්මාණය කරන ලද අළු සිමෙන්ති තට්ටු සහ අවම අලංකරණයෙන් යුත් ඇළ දිගේ ඇති කුටිවල අද්විතීය සරල ගෘහ නිර්මාණ ශිල්පය, වැවේ සන්සුන් හා නොකැළඹෙන ජලය පිළිබිඹු කිරීමට උත්සාහ කරයි.

## නෙළුම් කුලුණ



නෙළුම් කුළුණ (නැතහොත් කොළඹ නෙළුම් කුළුණ) , ශ්‍රී ලංකාවේ, කොළඹ නගරය තුල ඉදි කර ඇති 2019/09/16 දින නිළ වශයෙන් විවෘත කරන ලද මීටර 350 ක් උසැති කුළුණක් වන අතර, මෙය නෙලුම් පොහොට්ටුවක හැඩ ඇති නිසා "නෙලුම් කුලුණ" ලෙස නම් කෙරේ.

## කොළඹ කොඩි ගහ



කොඩි ගහේ ඉතිහාසය සැලකූ විට ලංකාව ආක්‍රමණය කල ප්‍රථම යුරෝපීය ජාතිකයන් වන පෘතුගීසීන් දක්වා දිවයයි. මෙහි ලා සඳහන් කළ යුත්තේ කොඩි ගහ ගැන සඳහන් කරමින් පෘතුගීසි යුගය ගැන ලියවීම් කල ලියුම් කරුවන් දෙපළක් වන රොබෙයිරෝ සහ ක්වේරෝස් යන දෙපළයි මොවුන්ගේ ලේඛනවල කොළඹ කොඩි ගහ ගැන සඳහන් වෙනවා. ඒ අනුව අනුමාන වශයෙන් කොඩි ගහ කොළඹ සිටුවනු ලැබ තිබෙන්නේ 1521 වර්ෂයෙයි. මුලින් මෙතරම් උස කොඩි ගහක් සිටුවීමේ අරමුණ වෙලා තියෙන්නෙ ලක්ෂෙට කොඩි දාන්න නෙමේ..මුදෙන් එන නැවු වලට කොළඹට එන පාර පෙන්නන්න කියලා තමයි කියන්නෙ . දවල්ට තද වර්ණ කොඩි එසවීමෙනුත් , රෑට කොඩි ගහේ ලාම්පු එල්ලීමෙනුත් මෙය කල බව වාර්තා වෙනවා. 1946 වෙනකල් මේ කොඩි ගහේ ලාම්පු දැල්වුන බවත් වාර්තා වේ.

## සිවන් කෝවිල



වර්තමානයේ අතිශය ජනාකීර්ණ පෙදෙසක් වන එහි පරිසරය කලබලකාරීය. මේ අතිශය කලබලකාරී ඝෝෂාකාරී පරිසරයේම දහසක් ජනතා ප්‍රාර්ථනා ගොනු වූ තවත් ආගමික සංහිඳක් දැකිය හැකිය. ඒ මෙරට හින්දු බැතිමතුන්ගේ ප්‍රධාන පුදබිමක් වන ශ්‍රී පොන්නම්බලම් වානේෂ්වරර් දේවාස්ථානම් නම් වූ පුදබිමයි. එය පොදු ජනතාව අතරෙහි ප්‍රචලිතව ඇත්තේ ‘සිවන් කෝවිල් ’ නමිනි. සිංහල දමිළ දෙපිරිසම කිසිදු භේදයකින් තොරව දේවාර්ශිවාද පතා පැමිනෙන සිවන් කෝවිල වනාහි කළුගලින් නිර්මාණය කරන ලද මෙරට සුවිසල්ම කෝවිල බව කියැවේ.

මෙයට වසර 144 කට පෙර මෙරට ජීවත් වූ පොන්නම්බලම් මුදලිවරයා මෙහි ආදි නිර්මාතෘය. ඔහු පූජනීය ස්ථාන වැදපුදා ගැනීමේ අදහසින් ඉන්දියාවේ කල සංචාරය මෙහි මූලාරම්භයට හේතු වී ඇත. ශිව දෙවියන් උදෙසා කොලඹ නගරයේ කෝවිලක් තැනීමේ අදහස ඔහුගේ සිතතුල ඇතිවූයේ ඉන්දියාවේ රාමේශ්වරමේදී බව පැවසේ. ඉන්දියාවේ සිට පැමිණි ඔහු ඉන් අනතුරුව වත්මන් කෝවිල පිහිටි ස්ථානයේම වර්ෂ 1856 දී ගඩොලින් කෝවිල තැනීම ඇරඹීය. ගඩොල් බැඳීමට හුනු, වැලි හා මී පැණි මිශ්‍ර බදාමයක් භාවිතා කෙරිනි. වර්ෂ 1857 වනවිට එහි සියළු වැඩ අවසන් කර කුම්භාභිශේකම් (කොත පැලදවීමේ) උත්සවය පවත්වා කෝවිල බැතිමතුන්ට විවෘතකර ඇත.

## කොළඹ දුම්රිය කෞතුකාගාරය

රාජ්‍ය දෙපාර්තමේන්තු හා ආයතන ද අදවන විට තමන්ගේ දෙපාර්තමේන්තුවේ හා ආයතනයේ ඓතිහාසිකත්වයේ මතකයන් එකතුරමින් කෞතුකාගාර ඉදිකර ඇත. මේ අතර දුම්රිය දෙපාර්තමේන්තු මගින් පවත්වාගෙන යනු ලබන දුම්රිය දෙපාර්තමේන්තු කෞතුකාගාරය අතිශය වැදගත් ය. යටත් විජිත සමයේ ආරම්භ වූ දුම්රිය දෙපාර්තමේන්තුව ලංකාවට ගෙන ආ මුල්ම ගල් අඟුරු දුම්රියේ ඇන්ජිමේ සිට වර්තමානය දක්වා ආ ගමන් මගේ විශේෂිත මතකයන් ඒකරාශි කර ඇත. මෙම සුවිශේෂ කෞතුකාගාරය ඕල්කෝට් මාවතෙහි පිහිටා ඇත.

## දීපාදුත්ථාරාම විහාරස්ථානය - කොටහේන බටහිර

මෙම විහාරය වර්ෂ 1775 පමණ කොළඹ නගරය තුළ ආරම්භ වූ ප්‍රථම විහාරස්ථානය මෙන්ම ප්‍රථම වතාවට බෞද්ධ කොඩියක් නිර්මාණය කර වර්ෂ 1885 අප්‍රේල් මස 28 දින ඔසවන ලද ස්ථානයයි.වර්ෂ 1908 දී තායිලන්ත ජාතික ප්‍රිස්ඩාන්සි චුන්සායි කුමාර හිමියන් විසින් නිර්මාණය කරන ලද , කපිලවස්තුපුර සර්වඥ ධාතු වහන්සේලා තැන්පත් කොට ඇති රත්න චෛත්‍ය ඉපැරණි විහාරස්ථානවලින් සමන්විත එක් ස්ථානයකි. බෞද්ධ ප්‍රබෝධයේ නියමුවා වූ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි වැඩ සිටි පුණ්‍ය භූමිය ද මෙයයි.





## ශ්‍රී පොන්නම්බලේශ්වරම් කෝවිල - කොටහේන බටහිර

මෙය වර්ෂ 1857 දි පොන්නම්බලම් මුදලියර් මහතා විසින් දෙමළ ජනතාවට වන්දනා කිරීමට ශිව දෙවියන් උදෙසා සාදන ලද  කෝවිලකි. එහි වහලය සඳහා භාවිතා කරන ලද කැටයම් හා මෝස්තර නිර්මාණය දමිළ සංස්කෘතිය මැනවින් විදහා පා ඇත. මෙය කළු ගලින් නිර්මාණය කරන ලද කෝවිල් අතර ප්‍රධාන කෝවිලකි.







## නැවේ පන්සල - ග්‍රෑන්ඩ්පාස් උතුර

මීට වසර 100 ට ඉහත දි ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා විසින් ඇරඹි මෙම විහාරය ලංකාවේ ප්‍රධාන පිවිසුම් මාර්ග යුගලයක් එක්වන සන්ධිස්ථානයක පිහිටා ඇත. සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ජය ශ්‍රී මහා බෝ සමිඳුන්ගේ දකුණත් ශාඛාව රැගෙන ලක්දිවට වැඩම කළ ශාසනික ඉතිහාසයේ ඉතා අඟනා සිදුවීමක් නිරූපණය කරන, කොළඹ වරාය පිවිසුමට යාබදව නෞකාවක හැඩයෙන් ඉතා අලංකාර ලෙස ඉදිකර කර ඇත. වසර 04 සිට ටිබෙට් ජාතික භික්ෂූන් වහන්සේ නමක් සතුව පැවති පෞරාණික වූත් වන්දනීය පූජනීය අති උත්තරීතර සැරියුත් මුගලන් අග්‍රශාවක මහ රහතන් වහන්සේලා දෙනමගේ ධාතූන් වහන්සේලා වැඩම කර සිටීම.

## ඕලන්ද කෞතුකාගාරය - පිටකොටුව

කුමාර විදියේ පිහිටා ඇති ඕලන්ද කෞතුකාගාරය ඉපැරණි ඉතිහාසයකට උරුම කම් කියන ගොඩනැගිල්ලකි. 1692-1696 ඉදිකර ඇත. මෙය ඕලන්ද ආණ්ඩුකාරවරුන්ගේ නිල නිවාස ලෙසින්ද භාවිත කර ඇත. ළිඳ සහිත මැද මිදුල, දැව සොල්දරය, ගඩොල් ඇතුරු බිම් පොළව වැනි ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණවලින් සමන්විත වේ. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ හමුදා රෝහලක්, යුධායුධ ගබඩාවක්, පොලිස් පුහුණු මධ්‍යස්ථානයක් ලෙසත් , අවසානයේ පිටකොටුව තැපැල් කාර්යාලය හා විදුලි සංදේශ මධ්‍යස්ථානයේ කෙ◌ාටසක් ලෙසත් භාවිතා කොට ඇත.









## කයිමන් දොරකඩ - පිටකොටුව

එවකට ඉදිකර තිබූ කයිමන් දොරටුවෙන් වර්තමානයේ ඉතිරිව ඇත්තේ එක් ඝණ්ඨාර කුලුනක් පමණි. එය මෙම දොරටුවෙන් ඇතුළු වන අය විසින් ආරක්ෂාව සඳහා හදිසි අවස්ථාවක දී නාද කිරීමට තිබූ එකක් හෝ, දොරටුව වසන විට නාද කළ එකක් ලෙස සලකනු ලබයි.
මෙහි පිහිටි ඝණ්ඨාර කුළුණ මීටර් හතරක් පමණ උස ආරුක්කු හැඩැතිය. මෙය බුවනෙකබාහු රජතුමා විසින් කතෝලික පියතුමන්ලාගේ ඉල්ලීමක් පිට වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශයේ සෑදූ ශාන්ත ප්‍රැන්සිස් ෆ්‍රැන්සිස් මුනිතුමන්ට කැප කරන ලද දේවස්ථානයකට අයිති ඝණ්ටාරයක් ලෙස සැලකේ. නිල වශයෙන් අවසන් වතාවට මේ ඝණ්ටාරය වාදනය වී ඇත්තේ බ්‍රිතාන්‍ය යුගයේදී බව සැලකෙන අතර ඒ 1926 ජනවාරි 21වෙනිද පස්වැනි ජෝර්ජ් රජුගෙ අභාවය දැනුම් දීමටත්, ජනවාරි 28 ඔහුගේ දේව මෙහෙය වෙනුවෙනුත් සහ 1945 අගෝස්තු 14 වැනිදා දෙවැනි ලෝක යුද්ධයේ අවසාන කාලයේ දී යුද්ධයේ අවසාන කාලයේ දී ජපානය යටත් වුන දිනයේ දී බව සඳහන්ය.





## කොළඹ පැරණි නගර ශාලාව - පිටකොටුව

මෙම ගොඩනැගිල්ල 1873 ඉදිකරණ ලද ඉපැරනි ගොඩනැගිල්ලකි. ඉහල මහල උත්සව සඳහාද බිම් මහල එක් කොටසක් ගිණි නිවන හමුදා අංගනයක් ලෙසින්ද අනෙක් කොටස ඉපැරණි යන්ත්‍රසූත්‍ර තැන්පත් කර ඇති කෞතුකාගාරයක් ලෙසද සමන්විතය.



## රතු පල්ලිය - පිටකොටුව

පිටකොටුවේ දෙවන හරස් වීදියේ පිහිටා තිබෙන ජෙම් උල් අල්ෆර් මුස්ලිම් දේවස්ථානය ආකර්ෂණීය ගොඩනැගිල්ලකි. කොළඹ නගරය වටා වසර දහස් ගණනක පටන් මුස්ලිම් ජනතාව සෙසු ජාතීන් සමඟ සහජීවනයෙන් ජීවන රටා පවත්වාගෙන යති.
පිටකොටුව ප්‍රදේශයේදී රතු පල්ලිය වෙත සෑම දෙනාගේම අවධානය යොමු වීම අරුමයක් නොවේ. මේ ගොඩනැගිල්ලට යොදා ඇති වර්ණ රටාව ඒ තරමටම විචිත්‍රවත් නිසාය. විවිධ සමාජ හැලහැප්පීම් අතර රතු පල්ලිය නිරුපද්‍රිතව පැවතීම මහත් භාග්‍යකමක් ලෙස මුස්ලිම් බැතිමත්හු සලකති. මුස්ලිම් ප්‍රජාවගේ ආගම ඇදහීමේ කටයුතු වෙනුවෙන් විශාල මෙහෙයක් කරන රතු පල්ලිය පිටකොටුවට එන මුස්ලිම් බැතිමතුන්ගේ සිය යාඥා කටයුතුවලට විශාල පහසුවක් සලසයි. යාඥා කාලයේදී සහ සිකුරාදා දිනයන්හි මුස්ලිම් නොවන අයට රතු පල්ලියට ඇතුළුවීමට අවසර නොමැති මුත් අන් අවස්ථාවන්හී එම තහනම ක්‍රියාත්මක නොවේ.





**මෙතෝදිස්ත දේවස්ථානය - මසංගස්වීදිය**

1816 දි ආසියාවේ ප්‍රථම මෙතෝදිස්ත දේවස්ථානය ලෙසින් ඉදිකරණු ලැබූ අතර මිෂනාරි අධ්‍යාපනයේ සුවිශේෂී ස්ථානයක් හොබවන ඓතිහාසික වටිනාකම්වලින් සමන්විත පුරාවිද්‍යාත්මක ස්ථානයකි. මෙම දේවස්ථානයේ ඇතුලත බිමෙහි දේවගැතිවරුන්ගේ ඉපැරණි සොහොන්ද දැක ගත හැකිය.



## සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානය - අලුත්කඩේ නැගෙනහිර

වසර 175ක් පැරණි දේවස්ථානයකි. එය Anglican සභාවට අයත්ය .ඉරිදා උදේ දේව මෙහෙය පැවැත්වෙන අතර, එය ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වේ.

## විද්‍යෝදය පිරිවෙන - මාලිගාකන්ද

මෙම පිරිවෙන 1873 දී අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමන්ගල හිමි විසින් ආරම්භ කරන ලදි. දෙවනුවට වැඩිම සර්වඥධාතූන් වහන්සේ තැන්පත් චෛත්‍ය වැඩ සිටීම, ලොවුතුරා බුදුරජාණන් වහන්සේ දානය වැළඳූ පාත්‍රධාතූන් වහන්සේගේ කොටසක් තැන්පත්ව සිටීම, අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමන්ගල හිමිගේ ඓතිහාසික අවාස ගෘහය පිහිටා තිබීම, ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා මුල් විමෙන් ගොඩනගන ලද ධර්ම මන්දිරය ඇති අතර එහි සිවිලිමේ දිසා කොඩි
ඇතුළු කොඩි රාශියක් හා විහාර මන්දිරය සුප්‍රසිද්ධ චිත්‍රශිල්පී සාර්ලිස් ගුරුවරයා විසින් චිත්‍රණය කර ඇත. ඔහු විසින් අඹන ලද අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමන්ගල හිමිගේ ප්‍රතිමාවක් ද මෙහි තැන්පත්ව ඇත.



## ශාන්ත ජේම්ස් දේවස්ථානය - මෝදර

මෙම දේවස්ථානය 1872 දී ඉදිකරන ලදි. වාස්තු විද්‍යාත්මක කටයුතු සහ සැලසුම ග්‍රීක හා රෝම ගෘහ නිර්මාණ ශිල්පයට අනුව සිදු කර ඇත. කුළුණු සහිත දැවැන්ත ව්‍යුහයකින් යුක්තය. දේවස්ථානයේ අභ්‍යන්තරය කලාත්මක ලෙස කැටයම් කර ඇති අතර, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සිතුවම් සහ මරියතුමියගේ සිතුවම් සිවිලිම මත දක්නට ඇත. මේවා මයිකල්ඇන්ජලෝගේ සිතුවම් අනුකරණය කළ දිවංගත හෙන්ඩ්‍රික්ස් මහතාගේ කලා කෘතිය. මෙම වෙනස් කිරීම් 1913 සිට 1918 දක්වා සිදු කරන ලදී.
1887 දී ඔරලෝසුව සමඟ සීනු කුඩුව ඉදිකරන ලදි. එය දකුණු ආසියාවේ විශාලතම සීනු කුඩුව ලෙස සැලකේ. නැගෙනහිර කොදෙව්හි අපෝස්තලික නියෝජිත මොන්සිනෝර් සෙලෙස්කි විසින් 1895 දෙසැම්බර් 15 වන දින බෙල්ෆ්‍රි පූජා කරන ලදී.







## මෝදර ක්‍රිස්තු දේවස්ථානය - ලුණුපොකුණ

ගල් පල්ලිය නමින් ප්‍රචලිත මෙම දේවස්ථානය 1852දී ඉදිකරන ලදි. ලෝක උරුමයක් වූ විස්මිත අංග්ලිකානු දෙව්මැදුර ලංකාවේ මුල්ම ආසන දෙව්මැදුරයි. මෙය ගෘහ නිර්මාණගත කළේ ආර්. සී. කාපෙන්ටර් නම් බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පියායි. ඉතා උස් වහලකින් යුත් තනි ගොඩනැගිල්ලක් වන මෙහි අත්තිවාරමට භාවිතා කර ඇත්තේ බ්‍රිතාන්‍ය නෞකා රැඳවීමට ගත් විශාල ගල්ය. මෙහි අතුරා ඇති පිඟන් ගඩොල් බ්‍රිතාන්‍යයෙන් ගෙන්වන ලද අතර ඒවායේ රදගුරු හිමි හිසේ පළඳින මකුටයක ලාංඡනය කාවද්දා තිබේ.
උස කුළුණේ ඇති විශාල සීනුව මහා බ්‍රිතාන්‍යයෙන් ගෙනෙන ලද්දකි. මෙහි ඇති අනර්ඝ පිත්තල රාජාලි රුව ඇතුළත් කියවීමේ ආසනය සහ චිත්‍ර ඇතුළත් වීදුරු ඉතා මනස්කාන්තයි. තවද මෙය බ්‍රිතාන්‍ය යුගයේ ඉදිකල අති විශිෂ්ටතම නිර්මාණයකි.

## පැරණි ලන්දේසි රෝහල

“Old Dutch Hospital” ලෙස ප්‍රසිද්ධ පැරණි ලන්දේසි රෝහල කොළඹ ඇති ඓතිහාසික වටිනාකමින් ඉහළම ගොඩනැගිල්ල ලෙස හැඳින්වීම වරදක් නැත. මෑත කාලීනව සංවර්ධනය කර සාප්පු සහ භෝජනාගාර සංකීර්ණයක් බවට පත් කර ඇති මෙම ගොඩනැගිල්ල කොළඹ ඉතිරි වී ඇති පැරණිම ගොඩනැගිල්ල ලෙසද දැක්වීමට පුළුවනි. ක්‍රිස්ටියන් ශ්වෙට්සර්ගේ වාර්තාවලට අනුව මෙම ගොඩනැගිල්ල 1681 සිට අද වන තුරුම නිරුපද්‍රිතව පවතී. අතීතයේ මෙම ගොඩනැගිල්ල භාර වී තිබුණේ ලන්දේසි නැගෙනහිර ඉන්දියා සමාගමටයි.පැරණි ලන්දේසි රෝහලේ ගොඩනැගිලි පහක් දැකගන්න පුළුවනි. මෙයින් හතරක් නිර්මාණය කර ඇත්තේ විශාල මැද මිදුලක් නිර්මාණය වන ලෙසට චතුරශ්‍රයක් වටේටයි. පස් වැනි ගොඩනැගිල්ල තියෙන්නේ අනෙක් ගොඩනැගිලි හතරත්, එයත් අතර තවත් මිදුලක් නිර්මාණය වෙන විදිහට. ඉදිරිපස ගොඩනැගිල්ලේ උඩු මහලකුත් දකින්නට ලැබේ.





## ජනාධිපති මන්දිරය - කොටුව

ලක්දිව දේශපාලනයට සම්බන්ධ ඉපැරණි ගොඩනැගිලි අතර කොළඹ කොටුවේ පිහිටි ජනාධිපති මන්දිරයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. වසර 200කටත් වඩා වැඩි ඉතිහාසයකට උරුමකම් කියන මෙම ගොඩනැගිල්ල එතෙක් මෙතෙක් ඉතිහාසයේ, ජනපතිවරු ඇතුළු ප්‍රභූන් රැසකටම සෙවණ සපයා ඇත.
කෙසේ නමුත් මෙම ගොඩනැගිල්ල 1804 වසරේ දී ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනාධිකාරිය යටතට පවරා ගනු ලැබිණි. ඉන්පසුව ලක්දිව ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූ ෆෙඩ්රික් නෝත් මෙහි පදිංචි විය. නෝත්ගෙන් පසුව ලක්දිව ආණ්ඩුකාර ධුරයට පත් වූ තෝමස් මේට්ලන්ඩ්ද මෙම මන්දිරය සිය නිල නිවස්නය බවට පත් කර ගත්තේය. මේට්ලන්ඩ් විසින් මෙම මන්දිරය කිංග්ස් හවුස් නමින් නම් කර තිබේ. බ්‍රිතාන්‍ය පාලන සමයේදී විවිධ අලුත්වැඩියා කටයුතු සහ විවිධ නව ඉදිකිරීම් සිදු කිරීම තුළින් මෙම ගොඩනැගිල්ලට නවමු පෙනුමක් ඇති විණි. එතුළින් මෙම මුල් ඉදිකිරීමේ වූ ලන්දේසී ගෘහ නිර්මාණ ශිල්පය සම්පූර් ණයෙන්ම පාහේ ඉවත්ව ගොස් බ්‍රිතාන්‍ය ගෘහ නිර් මාණ ශිල්පය ඉස්මතු වීම සිදු විය. විලියම් හෝර්ටන්, ස්ටුවර්ට් මැකෙන්සි යන ආණ්ඩුකාරවරු යටතේ මෙම ගොඩනැගිල්ල වෙනස්කම්වලට සහ අලුත්වැඩියාවන්ට ලක් කෙරුණි.
1837 වසරේ දී එංගලන්තයේ පාලන බලය හිමි වූයේ වික්ටෝරියා රැජිනටයි. එහි බලපෑම ලංකාවේ කිංග්ස් හවුස් නම් වූ මෙම ගොඩනැගිල්ලටද බලපෑවේය. කිරීටයේ පාලනය රැජිනියක් වෙත හිමි වීම නිසා 1837 වසරේදී කිංග්ස් හවුස් යන්න ක්වීන්ස් හවුස් ලෙස වෙනස් විය. වික්ටෝරියා රැජින බලයේ රැඳී සිටි 1901 වසර තෙක්ම ක්වීන්ස් හවුස් යන නාමය නොවෙනස්ව පැවතුණි. 1901 වසරේ එංගලන්තයේ පාලනය ජෝර්ජ් රජතුමාගේ පාලනයට නතු වූ අතර ඉන්පසුව යළිත් ක්වීන්ස් හවුස් නාමය, කිංග්ස් හවුස් ලෙස වෙනස් කෙරුණි. අනතුරුව 1972 වසර වන තෙක්ම එම නාමයෙන් හැඳින්වුණු මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වීමෙන් අනතුරුව ජනාධිපති මන්දිරය නමින් හඳුන්වනු ලැබීය. එයට හේතුව වූයේ ඉන්පසුව ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරුන් තම නිල නිවස්නය ලෙස මෙම ගොඩනැගිල්ල භාවිත කිරීමයි. ඒ අනුව 1972 වසරේ සිට මේ දක්වාම ජනාධිපති මන්දිරය ලෙස මෙම ගොඩනැගිල්ල හඳුන්වනු ලබයි.





## ඕල්කොට් නිවස - කොටුව

ඕලන්ද පරිපාලනයට අදාල සියලු ගොඩනැගිලි කොටුව තුළ වූ අතර කොටුවෙන් පිටත පිටකොටුවෙහි වූයේ ප්‍රභූන්ගේ විසල් මන්දිරයන්ය. මැලිබන් වීදිය ඊට සාක්ෂි දරයි. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ නිවස පිහිටියේ මෙහිය. වසර ඒකසිය තිස් ගණනක් (130) පුරා නැගී හිදින මේ මන්දිරය අද පුරාවිද්‍යා ස්මාරකයකි.
කොස් දැවයෙන් කල විසල් උළුවහු හා ඉපැරණි ලුවර්ස් සහිත ජනේල පද්ධතිය ප්‍රභාවත් යුගයක නිහඩ සාක්ෂිකරුවන්ය. කුඩා කාමර කිසිත් වෙන් කොට නැති මේ නිවසේ බොහෝ තැන්වල ශාලාවල හැඩ ගනී. ඕල්කට්තුමා කොළඹ ආනන්දය පටන් ගෙන ඇත්තේ මෙතැනිනි. ළමුයින් 40 – 50 ක් පමණ බඳවා ගෙන මේ ස්ථානයේ පාඨශාලාව පවත්වාගෙන ගියේය. උඩු මහලේ ඉගැන්වීම් කර ගෙන ගිය අතර පහල කොටසක මුද්‍රණාලය හා සරසවි සඳරැස බෞද්ධ පුවත්පත පවත්වාගෙන ගොස් ඇත. ඊට මදක් ඉදිරියට වන්නට එතුමා පසු කලෙක ඇරඹූ පරම විඥාර්ථ බෞද්ධ සංගම් ගොඩනැගිල්ල දක්නට ඇත. මෙම ඕල්කට් නිවස 1999 වසරේ දී අංක 1085 හා 1999 ජුනි 18 දිනැති රජයේ ගැසට් නිවේදනය මගින් පුරා විද්‍යා සංරක්ෂිත ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත. ඕල්කට්තුමන් පරිහරනය කල පුටුව මේසය, කණ්ණාඩි මේසය සහ 19 වැනි සියවසට අයත් එතුමා වන්දනා කළ බුදු කුටිය අදත් අල්ලපු ඉඩමේ ඇති පරම විඥාර්ථ බෞද්ධ සංගම් ශාලාවේ තැන්පත් වී ඇත්තේ නිරුපද්‍රිතවය. වර්ග අඩි 2300 ක් පමණ වන මෙම ඕල්කට් නිවසේ උඩුමහලට යන දැවමය සෝපානයක් තිබූ බවට ද සාක්ෂි හමු වී ඇත.



## පැරණි තැපැල් කන්තෝරුව - කොටුව

එකල රජයේ කන්තෝරු, බැංකු, විශාල සමාගම්වල ප්‍රධාන කාර්යාල සියල්ල තිබුණේ කොළඹ කොටුවේ. එමෙන්ම ඊමේල්, ෆැක්ස් නොතිබුණ නිසා සේරම ගණුදෙනු වුණේ ලියුම් කියුම්වලින්. කොළඹ කන්තෝරුවල වැඩ කරපු අය ලියුම්, මනිඕඩර් යවන්න, මුද්දර ගන්න වගේ දේවල්වලට ගියේ “ජී පී ඕ” එකට. “ජනරල් පෝස්ට් ඔෆිස්" කියන එක කෙටි කරලා තමයි මේ “ජී පී ඕ” නම් හැදුණේ.
ඕනෑම රටකට ඇත්තේ ප්‍රධාන තැපැල් කාර්යාල (GPO) එකකි. මේ ගොඩනැගිල්ල ඉදි කළ බිම ඓතිහාසික එකකි. ඉපැරණි ලේඛන අනුව පෙනී යන්නේ ලොරන්සෝ ද අල්මේදා ලංකාවට ගොඩ බසින ලද ස්ථානය ඒ සමීපයේ වූ බවය. 1748 දී ඔගස්ටින් මිෂනාරිවරුන්ගේ දෙව් මැදුර හා සුසාන භූමිය පිහිටා තිබී ඇත්තේ මේ භූමියේය.
මෙම ගොඩනැගිල්ල සහිත සාලය නිර්මාණය කොට ඇත්තේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගෘහ නිර්මාණ ශිල්පී එච්.එෆ්. ටොම්ලින්සන් මහතා විසිනි. මෙම ගොඩනැගිල්ල වැඩ ආරම්භ කොට ඇත්තේ 1891 ඔක්තෝබර් 09 වැනිදාවකය. මෙම ගොඩනැගිල්ලේ ඇතැම් ඉදිකිරීම් යුරෝපීය පුනරුද ශෛලියට අනුගත වන බව (රෙනෙයියන්ග්) එයට

මුල් ගල තැබූ දින පළ කොට ඇති පුවත් පත් වාර්තාවක සඳහන් වේ. මෙම ගොඩනැගිල්ලට අවශ්‍ය කළු ගල් කුට්ටි කපා ගාල්ලේ වරායේ සිට ොකාළඹ වරායට ගෙනවිත් ඇත්තේ නැව් මාර්ගයෙනි. මෙම ගොඩනැගිල්ල නිම කිරීමේ කර්තව්‍යයට දේශීය මේසන් බාස්ලා මෙන්ම මූර්ස් ජාතික පෙදරේරුවන්ගේ සේවය ද ලබා ගෙන ඇත.
අදත් කොටුවේ පවතින පැරණි මන්දිරවල නිමවුම්කරුවන් ලන්දේසීන්ය. මේ තැපල් හල ඉදිරිපිට ඇති ජනපති මන්දිරය නොහෙ ාත් රජ ගෙදර ලන්දේසි ආණ්ඩුකාරවරයකු වූ වැන් එන්ජල් බික්ගේ නිවහනය. තැපැල් ගොඩනැගිල්ල ගොඩනැගූ වකවානුව වාර්තා කොට ඇති පරිදි පෙනී යන්නේ 1839 දී යුරෝපීයන් සොයාගත් ඡායාරූප ශිල්පය 1844 වන විට මෙරටට පැමිණි මෙම ගොඩනැගිල්ල ගොඩනගන ආකාරය ගැන එවකට පුවත්පත් ඡායරූප ද සමග වාර්තා කොට ඇති බවය.



## සාන්ත ලූසියා දේවස්ථානය - කොටහේන නැගෙනහිර

1760 දී කොටහේනේ ශාන්ත ලුසියා දෙව්මැදුර ආරම්භ කරන කොට තිබුණේ පොල් අතු මඩුවකි. අද අපි දකින මේ පල්ලියේ හැඩරුව හැදෙන්න ගත්තේ 1937 වගේ කාලවලදීය. අද වන විට කොළඹ ඇති විශාලම දෙව්මැදුර වන්නේද මෙයයි. රෙනේසන්ස් සහ බාරෝක් ගෘහ නිර්මාණ ශිල්පය මේ පල්ලිය ඉදි කිරීමේදී උපයෝගී කරගෙන ඇත.







**<u>කොළඹ ප්‍රදීපාගාරය - ගාලුමුවදොර</u>**

දැනට 29-මීටර-high (95 ft) ප්‍රදීපාගාරය 1952 දී ඉදිකරන ලද්දේ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස පරණ කොළඹ ප්‍රදීපාගාරය අක්‍රිය කිරීමෙන් පසුව අවට ගොඩනැගිලිවල ආලෝකය අපැහැදිලි වූ විටය. එය විවෘත කරනු ලැබුවේ ලංකාවේ පළමු අග්‍රාමාත්‍ය ගරු ඩී. එස් . කොන්ක්‍රීට් පදනමක් මත ඉදිකර ඇති අතර එය 12 m (39 ft) උස, එහි පාමුල සිංහ පිළිම හතරක් ඇත.

**<u>කාගිල්ස් ගොඩනැගිල්ල - කොටුව</u>**

ශ්‍රී ලංකාවේ හදවත බඳු කොළඹ කොටුවට පිවිසෙන්නකුට යටත් විජිත යුගයට අයත් පෞරාණික ගොඩනැඟිලි රැසක්ම දැකගත හැක. ඒ අතර එක්වරම නෙත් ඇදගන්නා සුවිශේෂී ගොඩනැඟිල්ලක් ඇත. යෝක් වීදිය, බාරොන් ජයතිලක මාවත (ප්‍රින්ස් ස්ට්‍රීට්), මුදලිගේ මාවත (බේලි ස්ට්‍රීට්) යන මාවත්වලට මායිම්ව පිහිටා ඇති ආරුක්කු රැසකින් හා පුළුල් කොරිඩෝවකින් මෙන්ම මල්ලියකමින් අලංකාර වූ රතු සහ සුදු පැහැයෙන් වර්ණ ගැන්වුණු මෙම ගොඩනැඟිල්ල හඳුන්වන්නේ කාගිල්ස් සහ මිලර්ස් ගොඩනැඟිල්ල ලෙසිනි. එහි එක් පසෙක කාගිල්ස් වෙළෙඳ සලත් අනික් පසින් මිලර්ස් වෙළෙඳ සලත් සියවසරකට අධික කාලයක් මුළුල්ලේ පවත්වාගෙන යනු ලැබිණි.
කාගිල්ස් වෙළෙඳ ව්‍යාපාරයට සහ එම ගොඩනැඟිල්ලට ඇත්තේ අපූරු ඉතිහාසයකි. 18 වැනි සියවසේ එංගලන්තයේ ව්‍යාපාර පවත්වාගෙන ගිය විලියම් මිල්නේ එවක එංගලන්තයේ යටත් විජිතයක් වූ ලංකාවේ ද ව්‍යාපාරයක් ආරම්භ කිරීම පිණිස මෙරට පැමිණියේය. 1844 දී ඔහු කොළඹ කොටුවේ “මිල්නේ සහ සමාගම” නමින් ව්‍යාපාරයක් ආරම්භ කළේය.







<u>**වැතම් වීදියේ ප්‍රදීපාගාරය සහිත ඔරලෝසු කණුව - කොටුව**</u>

කොළඹ කොටුව පැරණි ප්‍රදීපාගාරය සහ ඔරලෝසු කණුව ශ්‍රී ලංකාවේ දැකගත හැකි, ඔරලෝසු සවිකරන ලද එකම ප්‍රදීපාගාරය වේ. ප්‍රදීපාගාරයක් වුවත් එය වර්ථමානය වන විට අක්‍රීය කොට තිබෙන අතර, ඒ වෙනුවට එය ඔරලෝසු කණුවක් ලෙස ප්‍රයෝජනයට ගැනේ. කණුව, කොළඹ කොටුවේ වැතම් වීදිය හා ජනාධිපති මාවත අසල හන්දියෙහි පිහිටුවා ඇත.මෙම ප්‍රදීපාගාර ලාම්පුව සහිත ඔරලෝසු කණුව, ලංකාවේ ඉදිකරන ලද මුල්ම ප්‍රදීපාගාරය ලෙසද සැලකේ. එසේම කොළඹ සිට පිට පළාත්වලට ප්‍රධාන මාර්ගවල දුර මනිනු ලබන්නේද මෙහි සිට බවද සඳහන්ය.
860 වසරේදී මුලින්ම ඔරලෝසු කණුවක් ලෙස ප්‍රයෝජනයට ගැනීම උදෙසා මෙම කුළුණ ඉදිකලත්, පසුව 1865 වසරේදී ඊට ප්‍රදීපාගාර ලාම්පුවක් සවි කල බව පැවසෙයි. 1913 වසරේදී මෙහි වූ මුල් ඔරලෝසුව ප්‍රතිස්ථාපනය කරන ලදී. පසුකාලීනව කණුව අවට ඉදිකරන ලද උස් ගොඩනැගිලි හේතුවෙන්, ප්‍රදීපාගාර ආලෝකයට බාධා පැමිණීම නිසා, 1952 වර්ෂයේදී කණුවෙහි වූ ප්‍රදීපාගාර ලාම්පුව භාවිතා කිරීම නවත්වා දමන ලදී. ඒ වෙනුවට නව ප්‍රදීපාගාරයක් කොළඹ, ගල්බොක්ක ස්ථානයේ පිහිටුවන ලදී.



## ගෝල් ෆේස් හෙවත් ගාලු මුවදොර - ගාලුමුවදොර

අපේ රටේ කොළඹ යැයි කියූ පමණින්ම අපට අද සිහිවන්නේ මුළු කොළඹම ලෝකයා හමුවේ තැබූ ඒ ගාලු මුවදොර පිටියයි. එසේත් නැත්නම් අපි හොඳින්ම දන්නා හඳුනන ගෝල්ෆේස් පිටියයි. ගෝල්ෆේස් පිටියට ඉතා දිගු අපූරු ඉතිහාසයක් තිබේ. එය අතීතය තුළ තුරඟ තරඟ පිටියක් ලෙසින් භාවිත කළ බව අදටත් ප්‍රසිද්ධ වූ රහසකි. එමෙන්ම ගාලුමුවදොර වරෙක වධකාගාරයක්ද විය. ඊට හේතුව එම පිටියේ ඉංග්‍රීසි හමුදාවේ යුද සෙබළකු එල්ලා මරා දැමීමට ඉදිකළ එල්ලුම් ගසයි. එමෙන්ම එදා සමාජයේ ඉහළ පැලැන්තියේ සිටි මිනිසුන් ගාලුමුවදොර නැත්නම් ගෝල්ෆේස් පිටිය තමන්ගේ ව්‍යායාම් කටයුතු සඳහාද යොදාගත් බව සඳහන් වෙයි. තවද අද මෙන්ම එදාද මේ ගාලුමුවදොර යනු සංචාරකයන්ගේ අපූරු පාරාදීසයකි. මේ අතර තවත් සුවිශේෂී හේතුවක් නිසාවෙන්ද ගාලුමුවදොර පිටිය අපට වැදගත්ය. එනම් මැයි පළමු වැනිදාට යෙදෙන ලෝකයම සමරන ජාත්‍යන්තර කම්කරු දිනය නිසාය. ඒ අනුව එදා ලංකා ඉතිහාසයේ කළ පළමු මැයි රැලියූ 1933 වර්ෂයේදී කොළඹ ප්‍රයිස් පිටියෙන් ආරම්භ වූ අතර එය අවසන් කර තිබෙන්නේ ගාලුමුවදොර පිටියෙනි. එය ලංකා ඉතිහාසයේ සිදු වූ ඉතා වැදගත්ම සිදුවීමක් ලෙස සඳහන් කළ හැකිය. ගොල්ෆේස් පිට්ටනියට ඉතා දිගු ඉතිහාසක් පවතී.මෙය ඉතා අතීතයේ වධකාගාරයක් වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. ගොල්ෆේස් පිට්ටනියට විශාල දේශීය හා විදේශීය සංචාරකයින් පිරිසක් පැමිනේ.ඒ ආශ්‍රිතව පිහිටා ඇති මුහුදු වෙරළ සංචාරකයින්ගේ දැඩි ආකර්ෂණයට ලක්වේ.මේ ආශ්‍රිතව පහත සංචාරක හෝටල්ද පවතී.

- ටාජ් සමුද්‍ර හෝටලය
- ෂැංගිලා හෝටලය
- ගොල්ෆේස් හෝටලය
- රාමදා හෝටලය



## <u>මරදාන ජුම්මා මස්ජිදය- මරදාන</u>

මරදාන ජුම්මා මස්ජිදය මරදාන දුම්රිය ස්ථානයට පිවිසෙන දොරටුව ඉදිරිපිට පිහිටා ඇති අතර එය අමතක කිරීමට අපහසු මරදානේ තවත් සන්ධිස්ථානයකි. එය සහිරා විද්‍යාලය පිහිටි පරිශ්‍රයේම පිහිටා තිබුණද, 1892 දී පාසල විවෘත කිරීමට බොහෝ කලකට පෙර එම පරිශ්‍රයේ මුස්ලිම් පල්ලිය පිහිටා තිබුණි. මුලදී කුඩා සිද්ධස්ථානයක් වූ අතර, වසර ගණනාවක් පුරා ත්‍යාගශීලී අනුග්‍රාහකයන් බොහෝ දෙනෙකුගේ පරිත්‍යාගය ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරීම සඳහා උපකාරී විය. ගොඩනැගිලි.



## කොළඹ ඩෙල්ෆ්ට් දොරටුව - කොටුව

ප්‍රධාන දොරටුවක් වුණ 'ඩෙල්ෆ්ට් ගේට්' දොරටුව අද දක්නට ලැබෙන්නෙ බ්‍රිස්ටල් වීදිය පසින් කමර්ෂල් බැංකු භූමියේය. ඩෙල්ෆ්ට් දොරටුව ; ඩෙල්ෆට් සහ හූන් බැස්ටියම් අතර පිහිටි අතර එය පිටකොටුව දෙසට විවෘත වන ලෙස පැවතී තිබෙනවා.කයිමන් දොරටුවේ සිට පැමිණෙන පිටකොටුව කෙලින් වීදිය සම්බන්ධ වි තිබෙන්නේ ඩෙල්ෆ්ට් දොරටුවටයි.
මෙය පෘතුගීසීන් විසින් නිර්මාණය කරන ලද අතර ලන්දේසීන් විසින් මෙය තවදුරටත් පුළුල් කරන ලදී. වර්තමානය වන විට කොළඹ කොටුවෙහි ඉතිරි වී ඇති එකම පිවිසුම් දොරටුව වන්නේ මෙයයි.





## ගෆූර් ගොඩනැගිල්ල - කොටුව

ගෆූර් ගොඩනැඟිල්ල යනු කොළඹ කොටුවේ ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ සහ ලේඩන් බැස්ටියන් වීදියේ කෙළවරේ පිහිටි ප්‍රමුඛ සිව්මහල් කුඤ්ඤ හැඩැති ගොඩනැඟිල්ලකි. මෙම ගොඩනැගිල්ල ඉදිකරන ලද්දේ රටේ පුරෝගාමී ස්වර්ණාභරණ සහ මැණික් ගල් වෙළෙන්දෙකු වන නූර්දීන් හජියාර් අබ්දුල් ගෆූර් වෙනුවෙන්ය. ගෆූර් 1894 දී කොළඹ බ්‍රිස්ටල් හෝටලයේදී N. D. H. අබ්දුල් ගෆූර් සහ පුත්‍රයෝ (මැණික්, මුතු සහ ස්වර්ණාභරණ අපනයනය, දියමන්ති ආනයනය) පිහිටුවන ලදී. ඔහු කොළඹ වරායට නැව්වලට නැව් විකිණීමට තනි අවසරය ලැබූ වෙළෙන්දන්ගෙන් කෙනෙකි. මැණික් හා ස්වර්ණාභරණ. 1901 දී ගෆූර්ට ඔවුන්ගේ රාජකීය සංචාරයේදී වේල්ස් කුමරුට සහ කුමරියට මුතු, දියමන්ති, මැණික් හා නිල් මැණික් සහ කලා නිර්මාණ ප්‍රදර්ශනය කිරීමේ වරප්‍රසාදය හිමි විය.





## පළමු පෘතුගීසි ස්මාරකය - කොටුව

පෘතුගීසි 'පද්‍රෝ' පිළිබඳ එකම දන්නා උදාහරණය - පෘතුගාලයේ ලාංඡනය සහිත විශාල ගල් පර්වතයක් 1898 සැප්තැම්බර් මාසයේදී ශාන්ත ලෝරෙන්කෝ හි පැරණි පෘතුගීසි පල්ලියට නුදුරින් පිහිටි බැටන්බර්ග් ගේට්ටුවේ වැඩ කරමින් සිටි කම්කරුවන් විසින් සොයා ගන්නා ලදී.'පද්‍රාඕ' යනු රාජකීය ගෘහයේ හෙරල්ඩික් මෝස්තරයක් වන අතර 16 වැනි සියවසේ මුල් භාගයේ පෘතුගීසි සොයාගැනීමේ යුගයේදී ඉඩම් හිමිකමක කොටසක් ලෙස මුල් පෘතුගීසි නාවික ගවේෂකයන් සහ මුහුදු යාත්‍රාකරුවන් විසින් බොහෝ විට පිහිටුවන ලදී. අප්‍රිකාවේ සහ ආසියාවේ රටවල පෘතුගීසි සොයාගැනීම්වලට හිමිකම් කියමින් යුරෝපයේ අනෙකුත් යටත්විජිත බලවතුන් අධෛර්යමත් කිරීම සඳහා එය කැටයම් කර ස්ථානගත කරන ලදී.





## පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල - කොටුව

පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, ශ්‍රී ලංකාවේ ජනාධිපති ලේකම් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලයි. කොළඹ කොටුව ප්‍රදේශයේ මුහුදට මුහුණලා පිහිටා ඇති එය කොළඹ ජනාධිපති මන්දිරයට ආසන්නයේ සහ මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ලට යාබදව පිහිටා ඇත. මෙම ගොඩනැගිල්ල 1983 දී ශ්‍රී ජයවර්ධනපුර නව පාර්ලිමේන්තු සංකීර්ණය විවෘත කරන තෙක් වසර 53ක් දිවයිනේ ව්‍යවස්ථාදායකය පවත්වාගෙන ගියේය.
බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී ලංකාවේ ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම සඳහා නව-බැරොක් ආකාරයේ ගොඩනැගිල්ල ඉදිකරන ලද අතර එය ශ්‍රීමත් හෙන්රි මැකලම්ගේ අදහසකි. මෙය පසුව 1920 දී රජය විසින් අනුමත කරන ලද ගාලු මුවදොර උතුරු කෙළවරේ ගොඩකරන ලද ඉඩමක ලේකම් කාර්යාලය, සභා ගර්භය සහ රජයේ කාර්යාල සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීමට කමිටුවක් විසින් කරන ලද යෝජනාවකට ඇතුළත් කරන ලදී. ලංකාවේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පී ඔස්ටින් වුඩ්සන්ට ගොඩනැගිල්ලේ සැලසුම භාර විය.



## කොළඹ වරාය සමුද්‍ර කෞතුකාගාරය - කොටුව

කෞතුකාගාරය පිහිටා ඇත්තේ 1676 දී ඉදිකරන ලද පැරණි ලන්දේසි බන්ධනාගාරයක වන අතර එය කොළඹ වරාය ප්‍රදේශය තුළ ඉතිරිව ඇති එකම ලන්දේසි යුගයේ ගොඩනැගිල්ල වේ. කෞතුක වස්තු සඳහා පහසුකම් සැලසීම සඳහා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර ප්‍රතිසංස්කරණය කර ඇත.
ශ්‍රී ලංකාව වටා ඇති වරාය, එහි සමුද්‍ර කර්මාන්තය සහ සාගරය ආශ්‍රිත ඓතිහාසික වැදගත්කමකින් යුත් විවිධ භාණ්ඩ ප්‍රදර්ශනය කෙරේ. නැව් ආදර්ශ ප්‍රදර්ශන සමඟ විජය රජුගේ සහ අනෙකුත් වැදගත් චරිතවල මූර්ති ද ප්‍රදර්ශනය කෙරේ. කොළඹ වරායේ ක්‍රමානුකූල සංවර්ධනය සංකේතවත් කරන කලා කෘති සහ ආකෘති සහ විවිධ කාලවලදී වරාය මෙහෙයුම් සඳහා භාවිතා කරන ලද උපකරණ ද ඇත.





## ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොලඹ සිර කුටිය - කොටුව

1815 මාර්තු 6 වන දින ඉංග්‍රීසින් විසින් රජු, ඔහුගේ පවුලේ අය සහ ඥාතීන් කොළඹට ගෙන එන ලදී. එම රජු ඉන්දියාවේ වෙල්ලෝර් වෙත පිටුවහල් කිරීමට වසරකට පමණ පෙර එනම් 1816 ජනවාරි 24 දක්වා ගාලුමුවදොර පිටියට ආසන්න ස්ථානයක රඳවා සිටි බව පැවසේ.
ශ්‍රී වික්‍රම රාජසිංහගේ රැඳවුම් කුටිය ලෙස හඳුනාගෙන ඇති කුටිය පිහිටා ඇත්තේ ලංකා බැංකු මාවත සහ ජනාධිපති මාවත යන මංසන්ධියේ සෙලින්කෝ බිල්ඩින් රථ ගාල් ප්‍රදේශයේ නමුත් පාරට පෙනෙන පරිදිය. දීප්තිමත් කහ සහ තැඹිලි පාටින් පින්තාරු කර ඇති මෙය අඩි 2 ක ඝන බිත්තියක් සහිත දළ වශයෙන් 8×5′ ගොඩනැගිල්ලකි. වහලය මාළු කොරපොතු  ආකාර මෝස්තරයකින් නිර්මාණය කර ඇත.






## Battenburg බැටරි බිත්තියේ ඉතිරි කොටස් - කොටුව

Battenburg Battery යනු ලන්දේසීන් විසින් මුහුදට විහිදුනු වරායේ අත මත තනන ලද තුවක්කු බැටරි දෙකෙන් එකකි. තුවක්කු බැටරියක් යනු තාප්පයකින් ආරක්ෂා කර ඇති තුවක්කු සැකැස්මක් වන අතර එය බලකොටුව මෙන් නොව කිසිදු සුවිශේෂී හැඩයක් අඩංගු නොවන අතර එය බලකොටුවෙන් ස්වාධීනව ඉදිකර ඇත. ලන්දේසීන් මෙම බැටරි දෙක, Battenburg සහ Waterpass වරායේ බාහුව මත මුහුදේ සිට ප්‍රවේශය ආවරණය වන පරිදි ඉදිකරන ලද අතර ඒවා ශක්තිමත් ගබඩා පේළි දෙකක් හරහා ප්‍රධාන කොටුවට සම්බන්ධ කළහ. ලන්දේසි බලකොටුව කඩා බිඳ දැමීමෙන් පසුව පවා අඛණ්ඩව යුධ කටයුතු සඳහා භාවිතා කළ එකම කොටස බැටන්බර්ග් බැටරියයි. මෙය බ්‍රිතාන්‍යයන් විසින් දෙවන ලෝක සංග්‍රාමය දක්වා කොළඹ ආරක්‍ෂා කළ තුවක්කු බැටරි හතරෙන් එකක් ලෙස භාවිතා කරන ලද අතර බ්‍රිතාන්‍යයන් එහි වෙරළබඩ කාලතුවක්කු පැටවීමේ අඟල් හයක බ්‍රීච් සවි කර ඇත.

දැනට ඉතිරිව ඇත්තේ මීටර් 60ක් පමණ දිගට විහිදුණු කබුක් සහ ගඩොලින් තැනූ ඇතැම් කොටස්වලට සාපේක්ෂව නව සිමෙන්ති කපරාරු කිරීම පමණි. නිරාවරණය වී ඇත්තේ මුහුදට විවෘතව තිබූ පැත්තයි, වරාය පුළුල් වීම නිසා එම ප්‍රදේශය දැන් පිරී ඇති අතර වරායේ අභ්‍යන්තරයට මුහුණලා ඇති තාප්පයේ පැත්ත කොන්ක්‍රීට් තාප්පයකින් මුද්‍රා තබා ඇත. මෑත කාලය වන තුරුම, දැන් ප්‍රදීපාගාරයේ පාමුල හමු වූ නාවික තුවක්කු, බැටන්බර්ග්හි සවි කර ඇත.





## ශාන්ත අන්තෝනි සිද්ධස්ථානය - කොච්චිකඩේ උතුර

පල්ලියේ මූලාරම්භය මුල් ලන්දේසි යටත් විජිත යුගයට සම්බන්ධ වන්නේ කතෝලික ආගම දිවයිනෙන් තහනම් කරන ලද අතර කතෝලික පූජකවරුන් සැඟවී සිට දේශනා පැවැත්වීමයි. ශා. ඇන්ටෝනියෝ දේශීය වෙළෙන්දෙකු ලෙස වෙස්වලාගෙන, මුට්වාල්හි ප්‍රාදේශීය ධීවර ප්‍රජාවක් සමඟ රැකවරණය සොයා ගත්තේය. ප්‍රාදේශීය ජනප්‍රවාදවලට අනුව ප්‍රජාව තම ගම්මානය මුහුද ඛාදනය වීම නැවැත්වීමට ඔහුගේ සහය පැතූ අතර, පියතුමා. ඇන්ටෝනියෝ මුහුදු වෙරළේ කුරුසයක් සිටුවා යාච්ඤා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මුහුද ගොඩ බැස ප්‍රජාව කතෝලික ආගමට හැරුණි. පසුව ලන්දේසි බලධාරීන් ඔහුට ඔහුගේ දේශන පැවැත්වීම සඳහා යම් ඉඩමක් ලබා දුන් අතර, එහිදී ඔහු පාදුවාහි ශාන්ත අන්තෝනි (Sant'Antonio da Padova) වෙනුවෙන් කැප කරන ලද මැටි ගඩොල් දේවස්ථානයක් ඉදි කළේය. ශා. ඇන්ටෝනියෝ දේවස්ථානය තුළ තැන්පත් කර ඇත.

1806, දෙව්මැදුර විශාල කරන ලද අතර, 1822 දී සභාවේ එක් සාමාජිකයෙක් ගෝවා වෙත ගොස් ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ ප්‍රතිමාවක් ගෙන එන ලදී, එය තවමත් පල්ලියේ පූජාසනයක් මත පවතී. නව දේවස්ථානයක් ඉදිකිරීම 1828 දී ආරම්භ කරන ලද අතර එය 1834 ජූනි 1 වන දින කැප කරන ලදී. පල්ලිය නව සම්භාව්‍ය ශෛලියෙන් ඉදිකරන ලදී.1938 දී පල්ලිය වැඩි දියුණු කර විශාල කරන ලද අතර, ප්‍රධාන පූජාසනය පිටුපස ගායක ගැලරියක්, පැත්තේ විශාල පියාපත් සහ ධර්මදූත නිවසක් සහ රැස්වීම් කාමරයක් එකතු කරන ලදී. විශාල කරන ලද පල්ලිය 1940 පෙබරවාරි 16 වන දින කැප කරන ලදී.





## මෙතෝදිස්ත දේවස්ථානය - කොච්චිකඩේ දකුණ

පිටකොටුවේ මෙතෝදිස්ත පල්ලිය යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි මෙතෝදිස්ත දේවස්ථානයකි. එය ශ්‍රී ලංකාවේ මෙන්ම ආසියාවේ පිහිටුවන ලද පළමු මෙතෝදිස්ත පල්ලිය ලෙස සැලකේ. දේවස්ථාන ගොඩනැගිල්ල ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙස රජය විසින් නිල වශයෙන් පිළිගෙන 2013 මැයි 17 දින රජයේ ගැසට් අංක 1811 යටතේ ප්‍රකාශයට පත් කරන ලදී.



## Colombo City Centre - ඉබ්බන්වල

කලම්බු සිටි සෙන්ටර් යනු මහල් **47** කින් යුත් මිශ්‍ර-භාවිත සංවර්ධන ව්‍යාපෘතියකි, එය මහල් පහකින් යුත් **3,675 m2** (වර්ග අඩි 39,560) සිල්ලර ව්‍යාපාර , කාමර 164 කින් යුත් හෝටලයක් සහ නේවාසික මහල් නිවාස **192** කින් සමන්විත වේ. කොළඹ **02,** ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ පිහිටි බේරේ වැව ඉදිරිපිට ගොඩනැගිල්ල පිහිටා ඇත. සිල්ලර වෙළඳ සංකීර්ණයේ තුන්වන මහලේ ආසන 415 කින් යුත් ආහාර ශාලාවක් වන අතර ආහාර අලෙවිසැල් 18-20 කින් සමන්විත වන අතර එය Food Studio (ශ්‍රී ලංකාව) විසින් මෙහෙයවනු ලැබේ.







## <u>ජේ.ආර්.ජයවර්ධන කේන්ද්‍රය - ඉබ්බන්වල</u>

ජනාධිපති කාර්යාලය භාරයේ පවතින ආයතනයක් වන ජේ.ආර්. ජයවර්ධන කේන්ද්‍රය, දිවංගත ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන මහතා පරිහරණය කළ භාණ්ඩ ඇතුළත් කෞතුකාගාරය සහ පුස්තකාලයක්ද පවතී. මහි එතුමා ජනාධිපතිවරයෙකු ලෙස කටයුතු කළ සමයේ ලැබු සමරු තිළිණ සහ සිහිවටන ඒකරාශි කොට අනාගත පරපුරට දැකබලා ගැනීමට සලස්වා ඇත.



## Crow Island Beach park – මට්ටක්කුලිය

උතුරු කොළඹ CBD සිට කිලෝමීටර් 7 ක් දුරින් පිහිටා ඇති Crow Island බොහෝ සාපරාධී ක්‍රියාකාරකම් සහ පුළුල් දූෂණය පිළිබඳ ඉතිහාසයක් ඇත. වසර ගණනාවක් පුරා, බොහෝ විරෝධතා වලින් පසුව, මෙම ප්‍රාදේශය පවුල් හිතකාමී, විනෝදාත්මක වෙරළ උද්‍යානයක් බවට පරිවර්තනය කර ඇත. මෙම උද්‍යානය 2016 අප්‍රේල් මාසයේදී මහජනතාව සඳහා විවෘත කරන ලද අතර කැලණි ගං මෝය මායිම් වේ. උද්‍යානය කඩොලාන සහ වගුරු බිම් මධ්‍යයේ සංවර්ධනය කර ඇති අතර වෙරළබඩ වෘක්ෂලතා මිශ්‍රණයකින් යුක්ත වේ. ඔබට මෙහි ඇවිදීමට හෝ වාඩි වී සුන්දර ජලය දෙස බලා විවේකීව කාලයක් ගත කළ හැකිය. මෙහිදී ඔබට රසවත්, වාඩි වී සිටින ආහාර වේලක් භුක්ති විඳිය හැකි බොහෝ අවන්හල් සහ කැෆේ සොයා ගත හැකිය.






## එල්ෆින්ස්ටන් රඟහල - මරදාන

මරදාන හරස් පාරේ පිහිටි එල්ෆින්ස්ටන් රඟහල මෙරට දෙවැනි පැරණිතම රඟහල වේ. මෙම රඟහල 1917 දී ඉන්දියානු චිත්‍රපට සමාගමක් වන මදන් තියටර්ස් විසින් විවෘත කරන ලද අතර එය මුලින් හැඳින්වූයේ 'දඑල්ෆින්ස්ටන් පික්චර් පැලස්' යනුවෙනි.
ගොඩනැගිල්ල වසර කිහිපයකට පසු ප්‍රතිසංස්කරණය කරන ලදී - නව ගොඩනැගිල්ල සඳහා මුල්ගල තැබුවේ 1925 දී, එවකට කොළඹ නගරාධිපති, H. E. නිව්හැම්, සහ ගෘහ නිර්මාණ ශිල්පී H. F. Billimoria විසින් නිර්මාණය කරන ලද ගොඩනැගිල්ල 1930 දී නැවත විවෘත කරන ලදී. එම අලුතින් ප්‍රතිසංස්කරණය කරන ලද Elphinstone රඟහල සියල්ල තිබුණි. මෙහි වර්තමානය වන විට රංග ශාලාවක සහ සිනමා ශාලාවක පහසුකම් පවතී.
එල්ෆින්ස්ටෝන් පසුව සිලෝන් තියටර්ස් විසින් මිලදී ගන්නා ලද නමුත් 1980 දී රජය විසින් අත්පත් කර ගෙන නැවත වරක් ප්‍රතිසංස්කරණය කර නැවත විවෘත කරන ලදී. එල්ෆින්ස්ටන් රඟහල නාට්‍ය, සංගීත සංදර්ශන, තිරගත කළ චිත්‍රපට වේදිකාගත කර ඇති අතර එය නාට්‍ය නරඹන්නන් සහ චිත්‍රපට රසිකයින් අතර ජනප්‍රිය වේ. එහි යටත් විජිත විලාසිතාවේ ගෘහ නිර්මාණ ශිල්පය වසර ගණනාවක් පුරා නොවෙනස්ව පැවතී.





## ටවර් රඟහල - මරදාන

1880 වර්ෂය වන විට කොළඹ නගරය පුරා සින්ක් තහඩු සෙවිලි කරන ලද තාවකාලික මඩු කුඩාරම් රුසක් පැන තැනුණේ නාට්‍ය වේදිකා ගත කිරීමේ අරමුණ සඳහාය. එකල කොළඹ වැසියන්ට විනෝදාස්වාදය සඳහා තිබුණු එකම ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යය නාට්‍යය පමණක් විය. මෙම තාවකාලික මඩු, පැවිලියන් තියටර්, පබ්ලික් හෝල්, සරස්වතී හෝල් ආදි වශයෙන් නම් කර තිබූ අතර, ඒවා යොදාගනු ලැබුවේ තාවකාලික රඟහල් වශයෙනි. ශ්‍රී ලංකාවේ ඉදිවූ ප්‍රථම ස්ථාවර රංග ශාලාව ටවර් රඟහලයි.
එය ගොඩ නගන ලද්දේ මරදානේ විසූ ව්‍යාපාරිකයෙකු වූ ජී.ඩී හෙන්ද්‍රික් සෙනවිරත්න මහතා විසිනි. අශ්ව ඉස්තාලයකට වෙන් කරන ලද ඉඩමක ප්‍රේක්ෂකයන් 800 කට ඉඩ-කඩ සහිත ශාලාවක්, බැල්කනියක් සහ නේපථ්‍යාගාරයක් සහිතව රංග ශාලාවක් ඉදි කිරීමට ඔහු තීරණය කළේය. ප්‍රධාන ශාලාවට යාබද ඔරලෝසු කණුව සැලසුම් කරන ලද්දේ ලන්ඩනයේ ඔරලෝසු කුළුණ නිරූපනය කිරීමටය. මෙය ටවර් රඟහල යන්නෙන් නම් කරන ලද්දේ ඒ සඳහාය. ටවර් රඟහල 1911 දෙසැම්බර් 06 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ජාතික වීරයෙකු වශයෙන් බුහුමන් ලද අනගාරික ධර්මපාලතුමන් විසිනි. ඊට පසු දින ලංකා ආණ්ඩුකාර සර් හෙන්රි මැකලන්තුමාගේ ප්‍රධානත්වයෙන් පණ්ඩුකාභය නමැති නූර්ති නාට්‍ය වේදිකා ගත කරන ලදී. 'පණ්ඩුකාභය' නාට්‍යයේ පිටපත් රචක හා අධ්‍යක්ෂවරයා වූයේ හෙන්ද්‍රික් සෙනවිරත්න මහතාගේ දියණිය හා විවාහ වී සිටි චාල්ස් ඩයස් නම් නීතිඥවරයායි. මෙම නාට්‍යයට අවශ්‍ය සියළුම ඇඳුම් පැළඳුම් බොම්බායේ (මුම්බායි) සිට ආනයනය කරන ලදී. ආරම්භයේ දී ටවර් රඟහල වෙන් කර තිබුනේ චාල්ස් ඩයස් විසින් ලියා අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය සඳහාය. එහෙත් පසුව නීතිඥ ජෝන් ද සිල්වාගේ නාට්‍ය ප්‍රදර්ශනය කිරීම ද අරඹන ලදී. මෙම යුගය හඳුන්වා දෙන ලද්දේ ටවර් යුගය නමිනි. එකල නිෂ්පාදනය කරන ලද නාට්‍ය නූර්ති හෙවත් නව නාට්‍ය නමින් හඳුන්වන ලද අතර ශ්‍රී ලාංකීය නාට්‍ය ඉතිහාසයේ එම ප්‍රභේදයට විශේෂ තැනක් හිමිවිය.

**සාන්ත සෙබස්තියන් දේවස්ථානය - අලුත්කඩේ නැගෙනහිර**



**ශ්‍රී සිව සුබ්‍රමනියම් හින්දු දේවාලය - අලුත්කඩේ නැගෙනහිර**



## මරදාන දුම්රියපොළ - මාළිගාකන්ද

1864 දී ලංකාවේ (ශ්‍රී ලංකාව) දුම්රිය ප්‍රථම වරට විවෘත කරන ලද විට, මරදාන ආසන්නයේ දැනට විශ්‍රාම ගොස් ඇති කොළඹ ටර්මිනස් දුම්රිය ස්ථානයේ දුම්රිය නවතා දමන ලදී. 1906 දී කොළඹ ප්‍රදේශය තුළ දුම්රිය ප්‍රතිසංවිධානය කිරීමේ ව්‍යාපෘතියක් දියත් කරන ලදී . කොළඹ ටර්මිනස් ස්ටේෂන් එක වසා දමා නව මරදාන ස්ටේෂන් එක ආරම්භ කරන ලදී.
මරදාන දුම්රිය ස්ථානයේ ප්‍රවේශපත්‍ර කාර්යාලය, ගිමන් කාමරය යනාදී වශයෙන් ශ්‍රී ලංකා දුම්රිය කාර්යාල යන දෙමහල් ගොඩනැගිල්ලකින් සමන්විත වේ. අඩිපාරකින් වේදිකාවට මඟ පෙන්වයි. ප්‍රධාන ගොඩනැගිල්ල බ්‍රිතාන්‍ය යටත් විජිත ගෘහ නිර්මාණ ශිල්පයට උදාහරණයකි.





## මරදාන පොලිසීය - මාළිගාකන්ද

පොලිස් මූලස්ථානය 1867 දී ආරම්භ කරන ලද අතර ඒ සඳහා මරදාන ප්‍රදේශය තෝරා ගන්නා ලදී. 1870 දී කැරලිකරුවන් පිරිසක් පොලිස් මූලස්ථානයට පහර දුන්හ. ප්‍රහාරය මැඩපැවැත්වීමට පොලිසිය සමත් වූ නමුත් පොලිස් මූලස්ථානයේ ගොඩනැගිල්ලට හානි සිදුවී ඇත.




## <u>මහබෝධි අග්‍රශ්‍රාවක විහාරස්ථාකය - මාළිගාකන්ද</u>

මහාබෝධි විහාරය යනු කොළඹ 10 හි පිහිටි බෞද්ධ විහාරස්ථානයකි. එය ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාරස්ථාන 3071 න් එකකි. මහාබෝධි විහාරයේ ලිපිනය මාලිගාකන්ද පාර, කොළඹ 10 යන ලිපිනයෙහි පිහිටා ඇත.
සර්වඥ ධාතූන් වහන්සේ 1851 දී එවකට ඉන්දියාවේ පුරාවිද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් කනිංහැම් විසින් සාංචියේ අංක III ස්තූපයෙන් සහ සාංචි අසල සත්ධාර ස්තූපයෙන් මතු කරන ලද ධාතූන් මෙහි තැන්පත් කර ඇත.



## ශ්‍රී කයිලසනාතර් ස්වාමි දේවස්ථානය - සුදුවැල්ල

කොළඹ නගර මධ්‍යයේ මරදානේ පිහිටා ඇති කපිතාන් උද්‍යානයේ ශ්‍රී කයිලේශ්වරම් කෝවිල කොළඹ පැරණිතම සිවන් කෝවිල ලෙස සැලකේ. කෝවිල පිහිටා ඇත්තේ මරදාන නගර මධ්‍යයේ වුවද, මෙය ඔබ සිතන තරම් පහසුවෙන් ප්‍රවේශ විය නොහැකි දුම්රිය මාර්ග ජාලයකින් සෑම පැත්තකින්ම හුදකලා වී ඇත. කෝවිල් වීදියට පිවිසීම ජනප්‍රිය සලකුණක් අසල පිහිටා ඇත, ඩී.ආර්.ගේ දෙවන පොත් සාප්පු. විජේවර්ධන මාවත සහ මාර්ගය කොටුව දුම්රිය මාර්ගය හරහා ගොස් කෝවිල් පිටියෙන් අවසන් වේ.



## ශ්‍රී සිවරාජ විනායගර් ස්වාමි කෝවිල - ජින්තුපිටිය

මෙම කෝවිල කොළඹ පිහිටි පැරණිම හින්දු කෝවිලක් වන අතර එහි ඉතිහාසය 19 වන ශතවර්ෂය දක්වා දිව යයි. මෙම කෝවිල සහ ගොඩනැගිල්ල හඳුන්වන්නේ රාම් ලාල් මහරාජා ධර්ම ශාලාව යනුවෙන්ය. මෙම ස්ථානය 1813 දී බැතිමතුන්ගේ වන්දනාමාන කටයුතු සඳහා සම්පූර්ණයෙන්ම කෝවිලක් ලෙස ඉදිකරන ලදී.



## ජම්පටා වීදිය, අංක 184 දරණ නිවස - ජින්තුපිටිය

බොහෝ වෙනස් කිරීම් සහිත තවත් කොළඹ ඉතිරිව ඇති ලන්දේසි නිවසකි. මෙය කොළඹ 13, ජම්පටා වීදියේ පිහිටා ඇත.



## මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ල - කොටුව

ලංකා ව්‍යවස්ථාදායක සභාව ව්‍යාප්ත වීමත් සමඟ එම සභාව සහ ලංකාවේ සිවිල් පරිපාලනය පවත්වාගෙන යාමට නව ගොඩනැගිල්ලක අවශ්‍යතාවය ශ්‍රීමත් හෙන්රි මැකලම් විසින් යෝජනා කරන ලදී. ගාලු මුවදොර උතුරු කෙළවරේ ගොඩකරන ලද ඉඩමක ලේකම් කාර්යාලය, සභා ගර්භය සහ රජයේ කාර්යාල සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීමට කමිටුවක් විසින් කරන ලද යෝජනාවක් 1920 දී ලංකා රජය විසින් පිළිගනු ලැබීය. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පී ඔස්ටින් ගොඩනැගිල්ලේ සැලසුම සඳහා වුඩ්සන් වගකිව යුතු විය. මෙම යෝජනා ක්‍රමය සඳහා රුපියල් 400,000 ක මූලික ඇස්තමේන්තුව පසුව පොදු වැඩ උපදේශක මණ්ඩලය විසින් රුපියල් 450,000 දක්වා සංශෝධනය කරන ලද අතර, අමතර වියදම් සැලකිල්ලට ගනිමින්. මෙම ගොඩනැගිල්ල 1930 ජනවාරි 29 වන දින ආණ්ඩුකාර ශ්‍රීමත් හර්බට් ස්ටැන්ලි විසින් විවෘත කරන ලදී.

නිදහසින් පසු, අමාත්‍ය මණ්ඩලය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා නව රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු පිහිටුවන ලදී. මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය ඇතුළු ප්‍රධාන දෙපාර්තමේන්තු රැසක් මෙහි තැන්පත් කර තිබුණි. වැඩි කල් නොගොස් රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු බොහෝමයක් ඒවායේ ව්‍යාප්තිය හේතුවෙන් ගොඩනැගිල්ලෙන් ඉවත් වී නව ගොඩනැගිලි වෙත ගෙන ගියහ. 1950 ගණන් වන විට මෙම ගොඩනැගිල්ල මහා භාණ්ඩාගාරය ලෙස හැඳින්වූ අතර 1980 ගණන් වන විට ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම මුදල් අමාත්‍යාංශය සහ එහි දෙපාර්තමේන්තු විසින් අත්පත් කර ගන්නා ලදී.




## ලෝක වෙළඳ මධ්‍යස්ථානය - කොටුව

ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි මීටර් 152 (අඩි 499) උසැති ද්විත්ව ගොඩනැගිල්ලකි. මහල් 39 කින් යුත් කුළුණු ඉදිකර ඇත්තේ මහල් 4 ක සිල්ලර වේදිකාවක් මත වන අතර, ඒ අනුව සෑම කුළුණකම මුළු බිම් ගණන 43 කි. WTCC හිමිකාරීත්වය සහ කළමනාකරණය Overseas Realty Ceylon PLC (ORCPLC) සතුය.

ගොඩනැගිල්ල ඉදිකර ඇත්තේ පිටත බිත්ති, තීරු සහ කදම්භ ව්‍යුහයන් සඳහා පෙර-නිර්මාණය කරන ලද පෙර-කාස්ට් කොන්ක්‍රීට් පැනල් භාවිතා කරමිනි. ගොඩනැගිල්ලේ සමබර මුහුණත බවට පත් කිරීම සඳහා පැනල් එකිනෙක හා කොන්ක්‍රීට් තට්ටුවට සවි කර ඇත. තීරු-කදම්භ ව්‍යුහයක් මඟින් රැගෙන යා හැකි පරිදි බර ද නිර්මාණය කර ඇති අතර මූලික බිත්ති වූයේ ගොඩනැගිල්ලේ මධ්‍යයේ පිහිටි සෝපාන, වැසිකිළි සහ හදිසි ගිනි පඩිපෙළයි.

## Grand Oriental hotel – කොටුව

මෙම වෙබ් අඩවියේ මුල් ගොඩනැගිල්ල වීථියට විවෘත වෙරන්ඩා සහිත සරල, තනි මහල් ව්‍යුහයක් විය, [1] ලන්දේසි ආණ්ඩුකාරයෙකු වාසය කළේය. 1837 දී එය බ්‍රිතාන්‍ය හමුදාව සඳහා බැරැක්ක බවට පරිවර්තනය විය. 1873 දී එය නේවාසිකාගාරයක් බවට පරිවර්තනය කරන ලද අතර, ප්‍රතිසංස්කරණය පෙබරවාරි 23 වන දින ආරම්භ කර එම වසරේම ඔක්තෝබර් 27 වන දින සම්පූර්ණ කරන ලදී.
කොළඹ ජාතික කෞතුකාගාරය, කොළඹ මහ රෝහල සහ කොළඹ ජාතික කෞතුකාගාරයේ වගකීම ද දැරූ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගෘහ නිර්මාණ ශිල්පී ජේම්ස් ජෝර්ජ් ස්මිදර් සම්බන්ධ කර ගනිමින් යුද හමුදා නේවාසිකාගාරය හෝටලයක් බවට පත් කිරීමේ කාර්යය එවකට ආණ්ඩුකාර ශ්‍රීමත් රොබට් විල්මට් හෝර්ටන් විසින් භාර ගන්නා ලදී. පැරණි කොළඹ නගර ශාලාව.




**<u>කොටුව දුම්රියපොළ - කොටුව</u>**

1864 දී ලංකාවේ (ශ්‍රී ලංකාව) දුම්රිය ප්‍රථම වරට විවෘත කරන ලද විට, මරදාන ආසන්නයේ දැනට විශ්‍රාම ගොස් ඇති කොළඹ ටර්මිනස් දුම්රිය ස්ථානයේ දුම්රිය නවතා දමන ලදී. කොටුව ලෙස හැඳින්වූ මුල්ම දුම්රිය ස්ථානය වූයේ 1877 දී වෙරළ තීරය ඉදිකරන විට ඉදිකරන ලද කුඩා දුම්රිය ස්ථානයකි. මෙම මුල් ස්ථානය පිහිටා ඇත්තේ අද කොටුව දුම්රිය ස්ථානයට බටහිර දෙසින් පිහිටි වර්තමාන ලේකම් කාර්යාලයේ හෝල්ට් අඩවියේය.
වත්මන් කොටුව දුම්රිය ස්ථානය 1917 දී කොළඹට නව මධ්‍යම දුම්රිය ස්ථානයක් ලෙස විවෘත කරන ලදී. මෙය මැන්චෙස්ටර් වික්ටෝරියා දුම්රිය ස්ථානයට සමානව ඉදිකර ඇත.මෙම දුම්රිය ස්ථානය ඉදිකර ඇත්තේ බේරේ වැවෙන් ගොඩකරන ලද ඉඩමකය. මෙම ව්‍යාපෘතිය 1906 දී ආරම්භ කරන ලද කොළඹ දුම්රිය මාර්ගය ප්‍රතිසංවිධානය කිරීමේ යෝජනා ක්‍රමයේ කොටසක් වූ අතර, එහිදී කොළඹ ටර්මිනස් දුම්රිය ස්ථානය වසා දමා නව මරදාන දුම්රිය ස්ථානය මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙය උත්සවාකාරයෙන් විවෘත කළේ ජී.පී. CGR හි සාමාන්‍යාධිකාරීවරයා වූ ග්‍රීන්. නගර මධ්‍යයට සේවය කිරීම සඳහා 1917 දී කොටුව එකතු කරන ලදී.






**<u>කොළඹ තරුණ බෞද්ධ සංගම් ගොඩනැගිල්ල - කොටුව</u>**

YMBA 1898 වසරේ සිට ශ්‍රී ලංකාව තුළ පවතින්නේ එකම අරමුණක් පෙරදැරි කරගෙනය. රටේ ප්‍රධාන බෞද්ධ ව්‍යාපාරයක් ලෙස YMBA තරුණ පරපුරට බුද්ධ ධර්මයේ ඉගැන්වීම් ප්‍රවර්ධනය කිරීමට අනුගත වී ඇත.






**<u>කොළඹ ක්‍රිස්තියානි සංගම් ගොඩනැගිල්ල - කොටුව</u>**



## ගලදාරි හෝටලය - කොටුව

Galadari Hotels (Lanka) 1980 හි සංස්ථාපිත කරන ලද අතර 1984 දී විවෘත කරන ලද හෝටලය Meridien Hotels විසින් ගලදාරි Meridien Colombo ලෙස කළමනාකරණය කරයි. Marriott Hotels & Resorts 1992 දී කළමනාකරණය භාර ගත් අතර හෝටලය Colombo Marriott Hotel ලෙස නම් කරන ලදී.



## හිල්ටන් හෝටලය - කොටුව

හෝටලයේ හිමිකාරීත්වය Hotel Developers (Lanka) Ltd. සතු වන අතර සමාගම 1983 දී සංස්ථාපිත කරන ලදී. සමාගම 1984 දී කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇත.



## සිනමන් ලේක් සයිඩ් හෝටලය - කොටුව






## ලේක් හවුස් ගොඩනැගිල්ල - කොටුව

සීමාසහිත ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර (ANCL), ලේක්හවුස් ලෙසද හැඳින්වේ. එය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂාවලින් දිනපතා තුනක්, සති අන්ත තුනක්, සතිපතා පහක්, මාසික දෙකක් සහ වාර්ෂික ප්‍රකාශන තුනක් ප්‍රකාශයට පත් කරයි.

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම යනු එහි නිර්මාතෘ ඩී.ආර්. විජේවර්ධන විසින් 1926 දී ශ්‍රී ලංකාවේ සංස්ථාපිත කරන ලද පොදු සීමිත වගකීම් සහිත සමාගමකි. එහි කොටස් වලින් 75% ක් 1973 අංක 28 දරන සිලෝන් ලිමිටඩ් සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර (විශේෂ විධිවිධාන) නීතිය යටතේ ජනසතු කරන ලද අතර මෙම කොටස් රජය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ මහා භාරකරු විසින් දරනු ලැබේ. ලේක්හවුස් ආයතනය ශ්‍රී ලංකාවේ පැරණිතම ප්‍රකාශන සමාගමයි.

**<u>කොටුව මහේස්ත්‍රාත් අධිකරණය - හුණුපිටිය</u>**




**<u>සුචරිතය - පිටකොටුව</u>**

ශ්‍රී ලංකාභිමාන්‍ය රණසිංහ ප්‍රේමදාස ජනාධිපති මන්දිරය කොළඹ පිහිටි කෞතුකාගාරයකි.

**<u>අබ්දුල් හමීඩ් වීදිය  රාත්‍රී අවන්හල - අලුත්කඩේ බටහිර</u>**



**<u>වන් ගෝල්ෆේස් වෙළඳ සංකීර්ණය - ගාලුමුවදොර</u>**





## 1.4 කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉතිහාසය හා ඓතිහාසික වැදගත්කම

### ❖ *කොළඹට නම හැදුනු හැටි*

කොළඹ" යන නාමයේ ප්‍රභවය ගැන නොයෙක් මත මෙන්ම විවිධ වූ මතාන්තරයන් ද ප්‍රචලිතව ඇත. යෝනකයින් පදිංචි වී සිටි මෙම ප්‍රදේශය සිංහලයන් හැඳින්වූයේ "කොළඹ" හෝ "කොලොන්තොට" නමිනි . මීට ප්‍රථමයෙන් සඳහන් වූ පරිදි චීන සංචාරකයන් කාඕ – ලන් – පු යන නාමය ව්‍යවහාර කළ අතර මොරොක්කෝ දේශිකයා "කාලෙන්බෝ" යන නාමයෙන් මෙම ස්ථානය හැඳින්වූයේය. පෘතුගීසීන් ලියූ යේ "කොලුම්බු" කියාය. ලන්දේසි, ප්‍රංශ හා ජර්මන් ජාතිකයන්ගේ සිතියම්වල "කලම්බු" සේ සඳහන්ව ඇත. රොබට් නොක්ස් (1681) හා අනෙක් පැරණි ඉංග්‍රීසි ගත්කරුවෝ පෘතුගීසීන් ලියූ පිළිවෙළටම කොළඹ නගර නාමය ලියූහ. දැනට එය ඉංග්‍රීසියෙන් "කලම්බු" යනුවෙන් ද සිංහලෙන් "කොළඹ" යනුවෙන් ද ව්‍යවහාරිතයි.

සිංහල භාෂාවෙන් "අඹ ගසේ කොළය" යන අර්ථය දෙන "කොළ අඹ" නියම නාමයයි. මේ සම්බන්ධයෙන් වඩාත් විස්තරාත්මක වර්ණනයක යෙදෙන රොබට් නොක්ස් මෙසේ පවසයි. "කොළඹ නගරයට බටහිර දිග්භාගයේ, ස්වදේශිකයන් අඹ ගස යන නමින් හඳුන්වන ගසක් තිබේ. අඹ ගසේ සාමාන්‍යයෙන් අඹ පල හට ගැනුනත් මේ ගසේ ඇත්තේ කොළ පමණක් නිසා ගස "කොළ - අඹ" යන නමින් හැඳින්වූ අතර ක්‍රිස්තියානින් කොලම්බස්ට ගෞරව කරනු වස් "කොලුම්බු" යන්න ඒ වෙනුවටයොදා ගෙන ඇත. මුහුදුබඩ ප්‍රදේශයේ ඇති ප්‍රධාන නගරය මෙයය. ප්‍රධාන ආණ්ඩුකාරයාගේ නිල නිවාසය ද මේ නුවර තුළ පිහිටා තිබුණි. ලන්දේසිවරුන් නගර ලාංඡනයට අඹ ගසක් හා පරෙවියකු තෝරා ගැනීමෙන් මෙය තවදුරටත් සනාථ කර තිබේ.



ලන්දේසි ලංකා යුගයේ කොළඹ ලාංඡනය, අඹ ගසක් නිරූපණය කරයි

## ❖ කොළඹ නගරයේ ඉතිහාසය කියන පැරණි ගොඩනැගිලි

පෘතුගීසි පාලකයන්ට ප්‍රථම චේතනාව වූයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ මිලට ගෙන අපනයනය කිරීමයි. ඒ සඳහා යුරෝපයට වඩාත් කිට්ටු බස්නාහිර වෙරළ තීරය භාවිත කිරීමට ඔවුන් තීරණය කළෝය. ලංකාවේ ඒ වන විට හිටපු දේශීය පාලකයන් මේ කටයුත්තට කැමති කර ගැනීමත් සමඟ කොළඹ ප්‍රදේශය මුලින්ම බිහි විය. 1796 අවුරුද්දේ ඉංග්‍රීසි ජාතිකයන් කොළඹ නගරය අත් පත් කර ගැනීමෙන් පසු ඔවුන් විසින් එය ශ්‍රී ලංකාවේ වාණිජ අග නගරය බවට පත් කරන ලද අතර එම තත්වය වර්තමානය වන විටද නොවෙනස්ව පවතී.

වරායක් ලෙස කොළඹ ප්‍රදේශය ඉන්දියානු, ග්‍රීක, චීන වගේම රෝම වෙළෙන්දන් අතර සුපල බව කවුරුත් විශ්වාස කරන කරුණකි තවද ක්‍රිස්තු වර්ෂ 8 වැනි සියවසේදී අරාබි වෙළෙන්දන් පිරිසක් කොළඹ ආශ්‍රිතව පදිංචි වුණු බවටත් මතයක් තිබේ.

කොළඹ ප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිවීම ආරම්භ වන්නේ වරාය නිර්මාණය කිරීමෙන් පසුව බවට අදහස් පවතී. වර්තමානයේ දකින්ට ලැබෙන ගොඩනැගිලි වලින් පැරණිම ඒවා අයිති වෙන්නේ ලන්දේසි යුගයටයි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ ලන්දේසින් කොළඹ අත්පත් කරගත්තාට පසු පෘතුගීසි ගොඩනැගිලි සියල්ලම විනාශ කිරීම බව සඳහන් කළහැකිය.

සාන්ත ලෝරන්ස් තුඩුවට සමීපව දැනට ඇති කොම්සේරියට් වීථියට ආසන්නයෙන් පරම්පරා ගණනක් යන තෙක් කොළ පමණක් මිස එල හට නොගත් සරුවට වැඩුන අඹ ගසක් තිබුණි. මේ වෘක්ෂයේ ශාඛා මණ්ඩපයින් කෙතරම් සරුවට වැවී තිබියේ ද යත් මුහුදේ සිට බලන්නකුට මෙය බිම් සළකුණක් ලෙස ද හඳුනා ගත හැකි විය.

අඹ ගස එක් මතාන්තරයකට මුල්ව ඇත. අනෙක කොලොන්තොටය. සර් එමර්සන් ටෙනන්ට්ගේ මතයට අනුව අගනුවරට කොලොන්තොට (කැලණි තොටුපල) යන නාමය ලැබුනේ ගංඟාවට ඇති සමීපත්වය නිසාය. ඔහු කියනුයේ මුස්ලිම් ජාතිකයන් විසින් නාමය "කලන් බූ" යන්නට වෙනස් කර ගෙන ඇති බවය. ඔහුගේ අදහසට අනුව නගරයේ නාමය "කොළම්බ" හෝ ඉකොළම්බු" සේ වැඩිදුරටත් වෙනස් වී ඇති අතර මෙරටට පැමිණි පෘතුගීසින්ට සිය නව දේශයේ නාමය ක්‍රිස්ටෝපර් කොලම්බස්ගේ නාමයට බොහෝසේ සමාන බැව් දැන ගැනීම ප්‍රීතියට කරුණක් වී ඇත.

කොළඹ ඉතිහාසය සම්බන්ධයෙන් පිළිගත් ඓතිහාසඥයකු වූ ඇස්. ජී. පෙරේරා පියතුමා කියනුයේ කොලොන්තොට යන නාමයට මුල් වූ කොලොන් ගඟ කැළණි ගඟ නොවන බවත්, එය ගංවතුර මෝය කරා ගෙන ගිය වෙනත් කුඩා ගංගාවක් බවත්ය. "කොළඹට බස්නාහිරින් කුඩා කඳු පන්තියක් විය. මේ කඳු මුදුන් හැඳින්වූයේ ආදුරුප්පු, අලුත්කඩේ හා සැන් සෙබැස්තියන් යන නම්වලිනි. කඳු දෙපැත්තේම පහත් බිම් තීරුය. කැළණි ගඟට හා මේ කඳු මුදුන්වලට මැදිවූ ප්‍රදේශයෙන් වගුරු බිම් තිබිණි. වගුරු බිම් මැදින් ගලා ගිය ගඟ කොළඹ වරාය හරි මැදින් බෙදෙමින් මෝයට වැටුණි. මේ කුඩා ගංගාව කැලණි ගඟින් පිටාර යන ගංවතුර වරායට ගෙන ගියේය. නාගලගම්වීදියෙහි දී බෙදී ගිය මේ ගඟට පෘතුගීසින් කීවේ "ඕ ග්‍රෑන්ඩේපාසේ" කියා ය. දැනට අපි මෙය ග්‍රෑන්ඩ්පාස් නමින් හඳුන්වමු.

බස්නාහිර පැත්ත බලා ගලා ගිය මේ කුඩා ගංගාව දෙකට බෙදී උස් ප්‍රදේශයන් දෙපැත්තේ ඇතිව ගලා ගියෙන් එම උස් ප්‍රදේශය "මැද දූව" නමින් යුත් දූපතක් බවට පරිවර්තනය වීය. දැනට තිබෙන ග්‍රෑන්ඩ්පාස් පාර විහිදී ඇත්තේ මේ දූපත මැදිනි. මේ දිය පාර කඳු පන්තිය අභිමුඛ වූ කල්හි දකුණු ඇලයට හැරී සාන්තබස්තියම හා දෙමටගොඩ කඳු අතරේ වූ විවරයකින් පහලට බැස මීට ටික කලකට ප්‍රථමයෙන් වැවක් නොවූ දැනට දුම්රිය පාර ඇති ප්‍රදේශය කරා ගලා ගොස් අන්තිමයේදී කයිමන් දොරකඩ ළඟින් මුහුදට වැටුණි. කලකට පසුව "බේරේ වැව" සාදනලද්දේ මේ කුඩා ගංගාව අවහිර කරමින්ය.

මේ සම්බන්ධයෙන් කිසිදු ග්‍රන්ථ රචකයකු විසින් ගංගාවේ නාමය සඳහන් කර නැත. ගිං තොටින් ගිං ගඟ ද කලුතරින් (කලුතොට) කලු ගඟ ද මුහුදට එක්වන්නා සේ කොළඹ යන නාමයේ අරුත කොලොන්තොටින් කොලොන් ගඟ මුහුදට ගලා බැසීම නිසා ඇතිවූයේ යයි සැලකේ. සංස්කෘත හා පාලි භාෂාවන්ගෙන් කාදම්බ සේ හඳුන්වනු ලබන තෘණ විද්‍යාඥයන් විසින් නෝකලී කාඩිපෝලියා සේ නම් කර ඇති වෘක්ෂය සිංහලෙන් හඳුන්වන්නේ "කොලොන්" කියාය. දැනට මල්වතු ඔය සේ හඳුන්වනු ලබන අනුරාධපුරයේ ඇති ගංගාව මහා වංශයේ හැඳින්වූයේ "කාදම්බ ගඟ" යන නමිනි. මහා වංශයේ සිංහල පරිවර්තකයා එයට කොලොන් ඔය යයි නම් කළේය. කොලොන්තොට භාවිතයේදී "කොළඹ" කියා ප්‍රචලිතව ගියේය. මේ නාමය මෙරටෙහිම බිහිවුණු නමක් (නිපන්) ලෙස සිංහල ව්‍යාකරණයෙහි නිදසුන් වශයෙන් පෙන්වා දී ඇත. මෙය වෙනත් භාෂාවකින් බිඳී ආ නාමයක් නොවේ. සඟනුවකට ලිපියක් සපයන, රාජකීය ආසියාතික සංගමයේ (ලංකා ශාඛාව) ජුලියස් ද ලැනරෝල් ශූරීහු "කොළඹ" යන සිංහල වචනයේ තේරුම වරාය, තොටුපල, නැව්තොට යනුවෙන් විග්‍රහ කර දී ඇත. මේ අනුව "කොළඹ" හා "තොට" යන්න සමාන බව පෙනේ. කාලයාගේ ඇවෑමෙන් කොළඹ ලංකාවේ බටහිර මුහුදු දිග්භාගයේ ඇති ප්‍රධානතම වරාය බවට පත්විය.

## වුල්වන්දාල් පල්ලිය

මෙම ගොඩනැගිල්ල ඉතා ආකර්ශණීය ගොඩනැගිල්ලක් නොවූවාට මෙය කොළඹ නගරයේ ඇති ඉපැරණීම ගොඩනැගිලි වලින් එකකි. පිටකොටුවේ වුල්වන්දාල් වීදියේ පිහිටා ඇති  මෙම ගොඩනැගිල්ල අයත් වෙන්නේ ඩොරික් ගෘහ නිර්මාණ කලාවටයි. මෙහි බිත්ති බොහොමයක් අඩි පහක් විතර පළලට ඉතාම ශක්තිමත්ව නිර්මාණය කර තිබීම විශේෂත්වයකි.

ලන්දේසීන්ගේ පාලන යුගය වන විට  මෙම ප්‍රදේශයේ බහුල වශයෙන් නරියන් ගැවසී ඇති බව වාර්තාවී ඇති මෙම නරින් වෘකයන් විදිහට වරදවා හඳුනා ගත් යුරෝපීයයන් මෙම ප්‍රදේශය හඳුන්වා ඇත්තේ වුල්වන්දාල් (Wolvendaal) නැතිනම් වෘක පළාත ලෙසය. වෘක පළාතේ ඉදිවූ පල්ලියට වුල්වන්ඩාල් පල්ලිය යැයි නම් කොට ඇත.

17 – 18 වැනි සියවස් වලට අයත් මේස, බංකු ඇතුළු ලී භාණ්ඩ තවමත් මේ පල්ලිය ඇතුලේ සුරැකිව තිබෙන අතර 1620 - 1936 යන කාල වකවාණුවල මෙම දේවස්ථානයේ ලියාපදිංචි කරන ලද විවාහයන් සහ බෞතීස්ම කිරීම් වල වාර්තා මෙහි ලේඛනාගාරයේ අදටත් දැක ගත හැකි වේ. අද වන විටද දේව මෙහෙයන් පැවැත්වෙන මේ පල්ලියේ ලිපි ලේඛන නෙදර්ලන්ත රාජකීය තානාපති කාර්යාලයේ අනුග්‍රහය යටතේ අදටත් සංරක්ෂණය කෙරේ.



## පැරණි ලන්දේසි රෝහල

“Old Dutch Hospital” ලෙස ප්‍රසිද්ධ පැරණි ලන්දේසි රෝහල කොළඹ ඇති ඓතිහාසික වටිනාකමින් ඉහළම ගොඩනැගිල්ල ලෙස හැඳින්වීම වරදක් නැත. මෑත කාලීනව සංවර්ධනය කර සාප්පු සහ භෝජනාගාර සංකීර්ණයක් බවට පත් කර ඇති මෙම ගොඩනැගිල්ල කොළඹ ඉතිරි වී ඇති පැරණිම ගොඩනැගිල්ල ලෙසද දැක්වීමට පුළුවනි. ක්‍රිස්ටියන් ශ්වෙට්සර්ගේ වාර්තාවලට අනුව මෙම ගොඩනැගිල්ල 1681 සිට අද වන තුරුම නිරුපද්‍රිතව පවතී. අතීතයේ මෙම ගොඩනැගිල්ල භාර වී තිබුණේ ලන්දේසි නැගෙනහිර ඉන්දියා සමාගමටයි.

පැරණි ලන්දේසි රෝහලේ ගොඩනැගිලි පහක් දැකගන්න පුළුවනි. මෙයින් හතරක් නිර්මාණය කර ඇත්තේ විශාල මැද මිදුලක් නිර්මාණය වන ලෙසට චතුරශ්‍රයක් වටේටයි. පස් වැනි ගොඩනැගිල්ල තියෙන්නේ අනෙක් ගොඩනැගිලි හතරත්, එයත් අතර තවත් මිදුලක් නිර්මාණය වෙන විදිහට. ඉදිරිපස ගොඩනැගිල්ලේ උඩු මහලකුත් දකින්නට ලැබේ.

කොළඹ ප්‍රදේශයේ ජීවත් වන ලන්දේසි ජාතිකයන්ට සහ කොළඹට පැමිණෙන නාවිකයන්ගේ රෝගාබාධවලටත් ප්‍රතිකාර කිරීමට සුදුසු මට්ටමේ උසස් රෝහලක අවශ්‍යතාව ලන්දේසි පාලකයන්ට දැඩිව අවශ්‍ය වූ අතර ඒ අනුව සියලූ වෛද්‍ය පහසුකම් සපිරි මෙම රෝහල ඉදි විය.





## ජනාධිපති මන්දිරය

ලක්දිව දේශපාලනයට සම්බන්ධ ඉපැරණි ගොඩනැගිලි අතර කොළඹ කොටුවේ පිහිටි ජනාධිපති මන්දිරයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. වසර 200කටත් වඩා වැඩි ඉතිහාසයකට උරුමකම් කියන මෙම ගොඩනැගිල්ල එතෙක් මෙතෙක් ඉතිහාසයේ, ජනපතිවරු ඇතුළු ප්‍රභූන් රැසකටම සෙවණ සපයා ඇත.

සියවස් දෙකකට පමණ පෙර ඉදි කර ඇති කොළඹ කොටුවේ ජනපති මන්දිර ගොඩනැගිල්ල එම භූමියේ ඉදිවන්නට පෙර එහි දේවස්ථානයක් පැවති බවට ඓතිහාසික වාර්තා සාක්ෂි දරයි. එය ලක්දිව ලන්දේසීන්ට යටත්ව තිබූ යුගයේ ඉදි කර තිබේ. පෘතුග්‍රීසින් පලවා හැර ලක්දිව ලන්දේසි පාලනය ගොඩනැගීමත් සමඟ මෙම පල්ලිය ඉදි කරවා තිබේ. ශාන්ත ෆ්‍රැන්සිස්කන් නමින් හැඳින්වූ මෙම පල්ලිය ඉදි කිරීමට ප්‍රථම මෙම භූමිය සුසාන භූමියක් ලෙසද භාවිත කළ බවට සාක්ෂි හමු වී ඇත. ඒ අනුව මෙම බිම්කඩ සුසාන භූමියක් ලෙස භාවිත කර ඇත්තේ ලක්දිව පෘතුගීසි පාලන සමයේදීය.

කෙසේ නමුත් මෙම ගොඩනැගිල්ල 1804 වසරේ දී ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනාධිකාරිය යටතට පවරා ගනු ලැබිණි. ඉන්පසුව ලක්දිව ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූ ෆෙඩ්රික් නෝත් මෙහි පදිංචි විය. නෝත්ගෙන් පසුව ලක්දිව ආණ්ඩුකාර ධුරයට පත් වූ තෝමස් මේට්ලන්ඩ්ද මෙම මන්දිරය සිය නිල නිවස්නය බවට පත් කර ගත්තේය. මේට්ලන්ඩ් විසින් මෙම මන්දිරය කිංග්ස් හවුස් නමින් නම් කර තිබේ. බ්‍රිතාන්‍ය පාලන සමයේදී විවිධ අලුත්වැඩියා කටයුතු සහ විවිධ නව ඉදිකිරීම් සිදු කිරීම තුළින් මෙම ගොඩනැගිල්ලට නවමු පෙනුමක් ඇති විණි. එතුළින් මෙම මුල් ඉදිකිරීමේ වූ ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පය සම්පූර්ණයෙන්ම පාහේ ඉවත්ව ගොස් බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්පය ඉස්මතු වීම සිදු විය. විලියම් හෝර්ටන්, ස්ටුවර්ට් මැකෙන්සි යන ආණ්ඩුකාරවරු යටතේ මෙම ගොඩනැගිල්ල වෙනස්කම්වලට සහ අලුත්වැඩියාවන්ට ලක් කෙරුණි.

1837 වසරේ දී එංගලන්තයේ පාලන බලය හිමි වූයේ වික්ටෝරියා රජිණටයි. එහි බලපෑම ලංකාවේ කිංග්ස් හවුස් නම් වූ මෙම ගොඩනැගිල්ලටද බලපෑවේය. කිරීටයේ පාලනය රජිනියක් වෙත හිමි වීම නිසා 1837 වසරේදී කිංග්ස් හවුස් යන්න ක්වීන්ස් හවුස් ලෙස වෙනස් විය. වික්ටෝරියා රජින බලයේ රැඳී සිටි 1901 වසර තෙක්ම ක්වීන්ස් හවුස් යන නාමය නෙවෙනස්ව පැවතුණි. 1901 වසරේ එංගලන්තයේ පාලනය ජෝර්ජ් රජතුමාගේ පාලනයට නතු වූ අතර ඉන්පසුව යළිත් ක්වීන්ස් හවුස් නාමය, කිංග්ස් හවුස් ලෙස වෙනස් කෙරුණි. අනතුරුව 1972 වසර වන තෙක්ම එම නාමයෙන් හැඳින්වුණු මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වීමෙන් අනතුරුව ජනාධිපති මන්දිරය නමින් හඳුන්වනු ලැබීය. එයට හේතුව වූයේ ඉන්පසුව ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරුන් තම නිල නිවස්නය ලෙස මෙම ගොඩනැගිල්ල භාවිත කිරීමයි. ඒ අනුව 1972 වසරේ සිට මේ දක්වාම ජනාධිපති මන්දිරය ලෙස මෙම ගොඩනැගිල්ල හඳුන්වනු ලබයි.




## කොළඹ ලන්දේසි කෞතුකාගාරය

පිටකොටුව ප්‍රදේශයේ තවමත් ඉතිරි වී ඇති ඉපැරණිතම ගොඩනැගිල්ල මෙම ලන්දේසි කෞතුකාගාරය වේ. පිටකොටුව කුමාර විදියේ මෙය පිහිටා ඇත. ලංකාවේ මුහුදුබඩ පළාත් පාලනය කරපු ඕලන්ද ජාතිකයන් වර්ෂ 1691 දී කොළඹ ආණ්ඩුකාරයා ලෙස පත් කර එව්වේ තොමස් වැන්රී ය. කොළඹ නගරයට පා තැබූ ඔහුට තුරුලතා ගහනය වූ පිටකොටුවේ කුමාර වීදියේ නිස්කලංක බවට කැමැත්තක් ඇති වී 1692 වසරේ දී විශාල මන්දිරයක් ඉදි කළේය. ක්‍රි.ව 1658 දී ආරම්භ වුණ ඕලන්ද පාලන සමය අවසන් වූයේ ක්‍රි.ව 1796 වසරේ දිය. තෝමස් වැන් ඊ රටින් පිට වීමට පෙර ඔහුගේ මන්දිරය V.O.C සමාගමට විකුණා දැමීය.

V.O.C සමාගම මගින් මෙම මන්දිරය පූජකවරුන් පුහුණු කරන සෙමනේරියක් හෙවත් දේවසත්හලක් බවට පත් කළේය. රෙපරමාදු ආගම පැතිරවීම සඳහා දැන උගත් පූජකවරුන් බිහි කිරීම ඔවුන්ගේ අරමුණ විය. සෙමනේරියට සමගාමීව එහි අනත්දරු පාසැලක් පවත්වාගෙන යාමක්ද සිදු විය. එදා කොටුව හා පිටකොටුව ලෙස බෙදා වෙන් කිරීම සිදු කලේ ඕලන්ද ජාතිකයන් විසිනි. ඕලන්ද සමය අවසාන වීමත් සමග සෙමනේරිය වැසී ගොස් එය හමුදා රෝහලක් බවට පරිවර්තනය කළේය.
පසු කාලයක ඉංග්‍රිසි ජාතිකයන් විසින් එය පොලිස් පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කරන ලදී. ක්‍රි.ව. 1930 දි පමණ පිටකොටුව තැපැල් කාර්යාලයක් බවට පත් වූ මෙය කලෙක වසා දමා තිබුණි. 1974 දි මෙහි කොටසක් කඩා වැටුණු අතර රජයේ මැදිහත් වීමෙන් එය යළි පිළිසකර කර ක්‍රි.ව 1982 වසරේ දි ඕලන්ද කෞතුකාගාරය බවට පත් කළේය. මෙම මන්දිරයේ උළු ඕලන්ද ජාතිකයන්ගේ පෞරුෂය විදහාපායි. මැද මිදුලක් වටා ගොඩනැගුණු නිවසේ සෑම බිත්තියකම පළල අඩි 3 කි. එය කබොක් දෙපේලියක් මැද සැදුනු වරිච්චි ක්‍රමයේ බිත්තියකි. සෑම උළුවස්සක්ම අඩි 11 උසය. කොස් ලීයෙන් කල සොල්දරය නැගීමට ඇති තරප්පු පෙල තේක්ක දැවයෙන් කරවූවකි. ජනේල පියන් ඇරෙන්නේ තප්පි ක්‍රමයටය. ඉහළ මාලයේ අල්මාරි පෙට්ටගම් සමූහයකි. සියල්ල දැවයෙන් කර ඇත. පහළ කාමර දෙපේලියකි. අද පිටකොටුව පොලිසිය තිබෙන තැන එදා ඕලන්ද පල්ලිය හා කනත්ත විය. පල්ලිය වෙනුවට පොලිසිය ඉදිවූ පසු එම කනත්ත ශේෂ වූ ස්මාරක ගලවා මෙහි ගෙනවිත් තිබේ. මෙම කෞතුකාගාරයෙහි ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ඕලන්ද ජාතිකයින් විසින් පාලනය කළ වකවානුවට (ක්‍රි.ව 1658 – 1796) අදාළ කෞතුක භාණ්ඩ තුන්දාහක් (3000) පමණ ප්‍රදර්ශනය කෙරේ.







## කයිමන් දොරකඩ

එවකට ඉදිකර තිබූ කයිමන් දොරටුවෙන් වර්තමානයේ ඉතිරිව ඇත්තේ එක් සණ්ඨාර කුලුනක් පමණි. එය මෙම දොරටුවෙන් ඇතුළු වන අය විසින් ආරක්ෂාව සඳහා හදිසි අවස්ථාවක දී නාද කිරීමට තිබූ එකක් හෝ, දොරටුව වසන විට නාද කල එකක් ලෙස සලකනු ලබයි.

කොළඹ කොටුවේ කෙලින් වීදියේ සිට ගැස් පහ හන්දිය දෙසට ගමන් කරද්දී දකුණු පස පිහිටි 4වැනි හරස් වීදියට පිවිසෙන ප්‍රධාන මාර්ගයට යාබදව මෙම සණ්ටාර කුළුණ පිහිටා ඇත.මෙම කයිමන්දොරකඩ විවෘතව තිබුණේ ශාන්ත ජෝන් ඇළ මාර්ගය මතින් ඉදිවුන පාලමකටයි. මෙය පෘතුගීසීන් විසින් "පූර්ටෙරෙයිනා" හෙවත් බිසෝ දොරටුව ලෙස හඳුන්වා ඇති අතර මීට කලින් මෙයට කයිමන් යන නම ලැබී ඇත්තේ ලන්දේසි යුගයේ බව සැලකෙයි.ඔවුන්ගේ බසින් කයිමන් ලෙස හඳුන්වන්නේ කිඹුලන්ට වන අතර මෙම ඇළේ නිතරම කිඹුලන් ගැවසුණු නිසා එම නමින් හඳුන්වා ඇති බවට සැලකේ.

මෙහි පිහිටි සණ්ඨාර කුළුණ මීටර් හතරක් පමණ උස ආරුක්කු හැඩැතිය. මෙය බුවනෛකබාහු රජතුමා විසින් කතෝලික පියතුමන්ලාගේ ඉල්ලීමක් පිට වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශයේ සෑදූ ශාන්ත ෆ්‍රැන්සිස් මුනිතුමන්ට කැප කරන ලද දේවස්ථානයකට අයිති සණ්ටාරයක් ලෙස සැලකේ. නිල වශයෙන් අවසන් වතාවට මේ සණ්ටාරය වාදනය වී ඇත්තේ බ්‍රිතාන්‍ය යුගයේදී බව සැලකෙන අතර ඒ 1926 ජනවාරි 21වෙනිද පස්වැනි ජෝර්ජ් රජුගෙ අභාවය දැනුම් දීමටත්, ජනවාරි 28 ඔහුගේ දේව මෙහෙය වෙනුවෙනුත් සහ 1945 අගෝස්තු 14 වැනිදා දෙවැනි ලෝක යුද්ධයේ අවසාන කාලයේ දී ජපානය යටත් වුන දිනයේ දී බව සඳහන්ය.





## ඕල්කොට් නිවස

ඕලන්ද පරිපාලනයට අදාල සියලු ගොඩනැගිලි කොටුව තුළ වු අතර කොටුවෙන් පිටත පිටකොටුවෙහි වුයේ ප්‍රභූන්ගේ විසල් මන්දිරයන්ය. මැලිබන් වීදිය ඊට සාක්ෂි දරයි. හෙන්රි ස්ටිල් ඕල්කට්තුමාගේ නිවස පිහිටියේ මෙහිය. වසර එකසිය තිස් ගණනක් (130) පුරා නැගී හිදින මේ මන්දිරය අද පුරාවිද්‍යා ස්මාරකයකි.

කොස් දැවයෙන් කල විසල් උළුවහු හා ඉපැරණි ලුවර්ස් සහිත ජනේල පද්ධතිය ප්‍රභාවත් යුගයක නිහඬ සාක්ෂිකරුවන්ය. කුඩා කාමර කිසිත් වෙන් කොට නැති මේ නිවසේ බොහෝ තැන්වල ශාලාවල හැඩ ගනි. ඕල්කට්තුමා කොළඹ ආනන්දය පටන් ගෙන ඇත්තේ මෙතැනිනි. ළමුයින් 40 – 50 ක් පමණ බදවා ගෙන මේ ස්ථානයේ පාඨශාලාව පවත්වාගෙන ගියේය. උඩු මහලේ ඉගැන්වීම් කර ගෙන ගිය අතර පහල කොටසක මුද්‍රණාලය හා සරසවි සදරුස බෞද්ධ පුවත්පත පවත්වාගෙන ගොස් ඇත. ඊට මදක් ඉදිරියට වන්නට එතුමා පසු කලෙක ඇරඹු පරම විඥාර්ථ බෞද්ධ සංගම් ගොඩනැගිල්ල දක්නට ඇත. මෙම ඕල්කට් නිවස 1999 වසරේ දි අංක 1085 හා 1999 ජුනි 18 දිනැති රජයේ ගැසට් නිවේදනය මගින් පුරා විද්‍යා සංරක්ෂිත ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත. ඕල්කට්තුමන් පරිහරණය කල පුටුව, මේසය, කණ්ණාඩි මේසය, සහ 19 වැනි සියවසට අයත් එතුමා වන්දනා කළ බුදු කුටිය අදත් අල්ලපු ඉඩමේ ඇති පරම විඥාර්ථ බෞද්ධ සංගම් ශාලාවේ තැන්පත් වී ඇත්තේ නිරුපද්‍රිතවය. වර්ග අඩි 2300 ක් පමණ වන මෙම ඕල්කට් නිවසේ උඩුමහලට යන දැවමය සෝපානයක් තිබු බවට ද සාක්ෂි හමු වී ඇත.



## රතු පල්ලිය

පිටකොටුවේ දෙවන හරස් වීදියේ පිහිටා තිබෙන ජෙම් උල් අල්ෆර් මුස්ලිම් දේවස්ථානය ආකර්ෂණීය ගොඩනැගිල්ලකි. කොළඹ නගරය වටා වසර දහස් ගණනක පටන් මුස්ලිම් ජනතාව සෙසු ජාතීන් සමඟ සහජීවනයෙන් ජීවන රටා පවත්වාගෙන යති.

මුල් වතාවට අරාබි මුස්ලිම් වෙළෙඳ නෞකාවක් මෙරටට පැමිණියේ කුළුබඩු සහ වෙනත් වටිනා ද්‍රව්‍ය සොයා ගෙනය. මේ අතර පිටකොටුව ආශ්‍රිතව ගුදමක් ආරම්භ කිරීමට ඔවුහු කල්පනා කළහ.පිටකොටුව ප්‍රදේශයේ මුස්ලිම් ජාතීන්ගේ වර්ග තුනක් වෙසෙති. ඔවුහු ශ්‍රී ලාංකේය මුස්ලිම්, ඉන්දියන් මුස්ලිම් සහ ජාවා වශයෙනි.ජාවා යනු මැලේසියාව මුල් කර ගත් මැලේ ජාතිකයන්ය.මැලේ ජාතිකයන් මෙරටට පැමිණියේ ලන්දේසි යුගයේදී ය. ඔවුන්ගේ සම්ප්‍රදායන් සහ ඉතිහාසය සෙසු මුස්ලිම් ප්‍රජාව 1909 වසරේ ඔවුන්ගේ යාඥා කටයුතු වෙනුවෙන් මෙම පල්ලිය ඉදි කරන ලදී. ජෙම් උල් අල්ෆර් මුස්ලිම් දේවස්ථානයේ රතු සහ සුදු ඉරි මඟින් මුස්ලිම් සංස්කෘතියේ අනන්‍යතාව ඉස්මතු වේ.

පිටකොටුව ප්‍රදේශයේදී රතු පල්ලිය වෙත සෑම දෙනාගේම අවධානය යොමු වීම අරුමයක් නොවේ. මේ ගොඩනැඟිල්ලට යොදා ඇති වර්ණ රටාව ඒ තරමටම විචිත්‍රවත් නිසාය. විවිධ සමාජ හැලහැප්පීම් අතර රතු පල්ලිය නිරුපද්‍රිතව පැවතීම මහත් භාග්‍යකමක් ලෙස මුස්ලිම් බැතිමත්හු සලකති. මුස්ලිම් ප්‍රජාවගේ ආගම ඇදහීමේ කටයුතු වෙනුවෙන් විශාල මෙහෙයක් කරන රතු පල්ලිය පිටකොටුවට එන මුස්ලිම් බැතිමතුන්ගේ සිය යාඥා කටයුතුවලට විශාල පහසුවක් සලසයි. යාඥා කාලයේදී සහ සිකුරාදා දිනයන්හි මුස්ලිම් නොවන අයට රතු පල්ලියට ඇතුළුවීමට අවසර නොමැති මුත් අන් අවස්ථාවන්හී එම තහනම ක්‍රියාත්මක නොවේ.





## පැරණි තැපැල් කන්තෝරුව

එකල රජයේ කන්තෝරු, බැංකු, විශාල සමාගම්වල ප්‍රධාන කාර්යාල සියල්ල තිබුණේ කොළඹ කොටුවේ. එමෙන්ම ඊමේල්, ෆැක්ස් නොතිබුණ නිසා සේරම ගණුදෙනු වුණේ ලියුම් කියුම්වලින්. කොළඹ කන්තෝරුවල වැඩ කරපු අය ලියුම්, මනිඕඩර් යවන්න, මුද්දර ගන්න වගේ දේවල්වලට ගියේ “ජී පී ඕ” එකට. “ජනරල් පෝස්ට් ඔෆිස්" කියන එක කෙටි කරලා තමයි මේ “ජී පී ඕ” නම් හැදුණේ.

ඕනෑම රටකට ඇත්තේ ප්‍රධාන තැපැල් කාර්යාල (GPO) එකකි. මේ ගොඩනැගිල්ල ඉදි කළ බිම ඓතිහාසික එකකි. ඉපැරණි ලේඛන අනුව පෙනී යන්නේ ලොරන්සෝ ද අල්මේදා ලංකාවට ගොඩ බසින ලද ස්ථානය ඒ සමීපයේ වූ බවය. 1748 දී ඔගස්ටින් මිෂනාරිවරුන්ගේ දෙව් මැඳුර හා සුසාන භූමිය පිහිටා තිබී ඇත්තේ මේ භූමියේය.

මෙම භූමිය යෝජිත ලංකාවේ මහ තැපැල් හල ගොඩනැගීමට තෝරා ගත් විට එහි වූ සොහොන් කොත් කොළඹ පිටකොටුවේ ඇති වත්මන් ඕලන්ද කෞතුකාගාරයට ගෙන ගොස් ඇත. එය 17 වැනි සියවසේ අගභාගයේ ඕලන්ද ආණ්ඩුකාර තෝමස් වැන් රී සිය නිල නිවාසය ලෙස ඉදිකරන ලද්දකි.

යෝජිත මහ තැපැල් හල භූමියේ වූ අනෙකුත් ආගමික ස්මාරක හා ඉතිරි සොහොන් ගල් ගෙන ගොස් ඇත්තේ ආදූරුප්පු වීදියේ වුල්ෆොන්ඩල් පල්ලියටය. එහි ඇතුළු බිමට දමා ඇති සොහොන් කොත්වල ඇති වර්ණයන් අධ්‍යයනයේ දී ඒ බව වඩාත් තහවුරු කර ගත හැකිය.
මෙම ගොඩනැගිල්ල සහිත සාලය නිර්මාණය කොට ඇත්තේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගෘහ නිර්මාණ ශිල්පී එච්.එෆ්. ටොම්ලින්සන් මහතා විසිනි. මෙම ගොඩනැගිල්ල වැඩ ආරම්භ කොට ඇත්තේ 1891 ඔක්තෝබර් 09 වැනිදාවකය. මෙම ගොඩනැගිල්ලේ ඇතැම් ඉදිකිරීම් යුරෝපීය පුනරුද ශෛලියට අනුගත වන බව (රෙනෙයියන්ග්) එයට මුල් ගල තැබූ දින පළ කොට ඇති පුවත් පත් වාර්තාවක සඳහන් වේ. මෙම ගොඩනැගිල්ලට අවශ්‍ය කළු ගල් කුට්ටි කපා ගාල්ලේ වරායේ සිට ොකාළඹ වරායට ගෙනවිත් ඇත්තේ නැව් මාර්ගයෙනි. මෙම ගොඩනැගිල්ල නිම කිරීමේ කර්තව්‍යයට දේශීය මේසන් බාස්ලා මෙන්ම මුර්ස් ජාතික පෙදරේරුවන්ගේ සේවය ද ලබා ගෙන ඇත.
අදත් කොටුවේ පවතින පැරණි මන්දිරවල නිමවුම්කරුවන් ලන්දේසීන්ය. මේ තැපල් හල ඉදිරිපිට ඇති ජනපති මන්දිරය නොහොත් රජ ගෙදර ලන්දේසි ආණ්ඩුකාරවරයකු වූ වැන් එන්ජල් බික්ගේ නිවහනය. තැපැල් ගොඩනැගිල්ල ගොඩනැගූ වකවානුව වාර්තා කොට ඇති පරිදි පෙනී යන්නේ 1839 දී යුරෝපීයන් සොයාගත් ඡායාරූප ශිල්පය 1844 වන විට මෙරටට පැමිණි මෙම ගොඩනැගිල්ල ගොඩනගන ආකාරය ගැන එවකට පුවත්පත් ඡායරූප ද සමග වාර්තා කොට ඇති බවය.



## කොටහේන සාන්ත ලූසියා දේවස්ථානය

1760 දී කොටහේනේ ශාන්ත ලුසියා දෙව්මැදුර ආරම්භ කරන කොට තිබුණේ පොල් අතු මඩුවකි. අද අපි දකින මේ පල්ලියේ හැඩරුව හැදෙන්න ගත්තේ 1937 වගේ කාලවලදීය. අද වන විට කොළඹ ඇති විශාලම දෙව්මැදුර වන්නේද මෙයයි. රෙනේසන්ස් සහ බාරෝක් ගෘහ නිර්මාණ ශිල්පය මේ පල්ලිය ඉදි කිරීමේදී උපයෝගී කරගෙන ඇත.

### කොළඹ ප්‍රදීපාගාරය

දැනට 29-මීටර-high (95 ft) ප්‍රදීපාගාරය 1952 දී ඉදිකරන ලද්දේ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස පරණ කොළඹ ප්‍රදීපාගාරය අක්‍රිය කිරීමෙන් පසුව අවට ගොඩනැගිලිවල ආලෝකය අපැහැදිලි වූ විටය. එය විවෘත කරනු ලැබුවේ ලංකාවේ පළමු අග්‍රාමාත්‍ය ගරු ඩී. එස් . කොන්ක්‍රීට් පදනමක් මත ඉදිකර ඇති අතර එය 12 m (39 ft) උස, එහි පාමුල සිංහ පිළිම හතරක් ඇත.

එය ඉදිරිපත් කළ ඉන්දියන් සාගරයේ දර්ශනීය දසුන නිසා එය නගර සලකුණක් බවට පත්විය. ශ්‍රී ලංකා සිවිල් යුද්ධය උත්සන්න වීමත් සමඟ එම ස්ථානයට මහජන ප්‍රවේශය සීමා විය. නාවික මූලස්ථානයේ සිට වීදිය හරහා සහ කොළඹ වරායට ආසන්නව පිහිටා ඇති හෙයින් එය අධි ආරක්ෂිත කලාපයක ස්ථානගත කිරීම ඊට හේතුවයි.

එහි පාදයේ පිහිටා ඇත්තේ නාවික තුවක්කු බැටරියක් වන අතර එය ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සාම්ප්‍රදායික තුවක්කු ආචාර සඳහා යොදා ගනී . සම්ප්‍රදාය අනුව නාවික හමුදාව විසින් ජාතික දිනයේදී තුවක්කු 25 ක් ආචාර කරනු ලැබේ. එය සෑම වසරකම පෙබරවාරි 4 වේ. එය ආරම්භ වූයේ 1951 පෙබරවාරි 4 වන දින අඟල් 4 තුවක්කුවකින් තුවක්කු 25 ක් ආචාර කරමින් නාවික හමුදාවේ පළමු යුද නෞකාව වන රාජකීය ලංකාවේ නාවික හමුදාවේ එච්.එම්.සී.එස් .


1952 දී එලිසබෙත් කුමරියගේ රාජකීය සංචාරය සඳහා සූදානම් වීම සඳහා අඟල් 4 තුවක්කු දෙකක් එක්සත් රාජධානියෙන් ගෙන එන ලද අතර, එය ඇගේ පියා වූ රජුගේ මරණය හේතුවෙන් අඩක් ආපසු එන විට සිදු නොවීය. එතැන් සිට ප්‍රදීපාගාරයේ තුවක්කු සවි කර ඇති අතර තුවක්කු ආචාර කිරීම. තවත් තුනක් 52 මිලිමීටර් තුවක්කු 2000 දී ඉන්දියානු නාවික හමුදාවේ තෑගි ලෙස එකතු කරන ලද අතර එය දැන් තුවක්කු ආචාර කරයි.



## කාගිල්ස් ගොඩනැගිල්ල

ශ්‍රී ලංකාවේ හදවත බඳු කොළඹ කොටුවට පිවිසෙන්නකුට යටත් විජිත යුගයට අයත් පෞරාණික ගොඩනැඟිලි රැසක්ම දැකගත හැක. ඒ අතර එක්වරම නෙත් ඇදගන්නා සුවිශේෂී ගොඩනැඟිල්ලක් ඇත. යෝක් වීදිය, බාරොන් ජයතිලක මාවත (ප්‍රින්ස් ස්ට්‍රීට්), මුදලිගේ මාවත (බේලි ස්ට්‍රීට්) යන මාවත්වලට මායිම්ව පිහිටා ඇති ආරුක්කු රැසකින් හා පුළුල් කොරිඩෝවකින් මෙන්ම මල්ලියකමින් අලංකාර වූ රතු සහ සුදු පැහැයෙන් වර්ණ ගැන්වුණු මෙම ගොඩනැගිල්ල හඳුන්වන්නේ කාගිල්ස් සහ මිලර්ස් ගොඩනැඟිල්ල ලෙසිනි. එහි එක් පසෙක කාගිල්ස් වෙළෙඳ සලත් අනික් පසින් මිලර්ස් වෙළෙඳ සලත් සියවසකට අධික කාලයක් මුළුල්ලේ පවත්වාගෙන යනු ලැබිණි.
කාගිල්ස් වෙළෙඳ ව්‍යාපාරයට සහ එම ගොඩනැඟිල්ලට ඇත්තේ අපූරු ඉතිහාසයකි. 18 වැනි සියවසේ එංගලන්තයේ ව්‍යාපාර පවත්වාගෙන ගිය විලියම් මිල්නේ එවක එංගලන්තයේ යටත් විජිතයක් වූ ලංකාවේ ද ව්‍යාපාරයක් ආරම්භ කිරීම පිණිස මෙරට පැමිණියේය. 1844 දී ඔහු කොළඹ කොටුවේ "මිල්නේ සහ සමාගම" නමින් ව්‍යාපාරයක් ආරම්භ කළේය.







## වැතම් වීදියේ ප්‍රදීපාගාරය සහිත ඔරලෝසු කණුව

කොළඹ කොටුව පැරණි ප්‍රදීපාගාරය සහ ඔරලෝසු කණුව ශ්‍රී ලංකාවේ දැකගත හැකි, ඔරලෝසු සවිකරන ලද එකම ප්‍රදීපාගාරය වේ. ප්‍රදීපාගාරයක් වුවත් එය වර්තමානය වන විට අක්‍රීය කොට තිබෙන අතර, ඒ වෙනුවට එය ඔරලෝසු කණුවක් ලෙස ප්‍රයෝජනයට ගැනේ. කණුව, කොළඹ කොටුවේ වැතම් වීදිය හා ජනාධිපති මාවත අසල හන්දියෙහි පිහිටුවා ඇත.
මෙම ප්‍රදීපාගාර ලාම්පුව සහිත ඔරලෝසු කණුව, ලංකාවේ ඉදිකරන ලද මුල්ම ප්‍රදීපාගාරය ලෙසද සැලකේ. එසේම කොළඹ සිට පිට පළාත්වලට ප්‍රධාන මාර්ගවල දුර මනිනු ලබන්නේද මෙහි සිට බවද සඳහන්ය.
860 වසරේදී මුලින්ම ඔරලෝසු කණුවක් ලෙස ප්‍රයෝජනයට ගැනීම උදෙසා මෙම කුළුණ ඉදිකලත්, පසුව 1865 වසරේදී ඊට ප්‍රදීපාගාර ලාම්පුවක් සවි කල බව පැවසෙයි. 1913 වසරේදී මෙහි වූ මුල් ඔරලෝසුව ප්‍රතිස්ථාපනය කරන ලදී.
පසුකාලීනව කණුව අවට ඉදිකරන ලද උස් ගොඩනැගිලි හේතුවෙන්, ප්‍රදීපාගාර ආලෝකයට බාධා පැමිණීම නිසා, 1952 වර්ෂයේදී කණුවෙහි වූ ප්‍රදීපාගාර ලාම්පුව භාවිතා කිරීම නවත්වා දමන ලදී. ඒ වෙනුවට නව ප්‍රදීපාගාරයක් කොළඹ, ගල්බොක්ක ස්ථානයේ පිහිටුවන ලදී.

## 1.5.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, ගම්වල නම් හා භූමි ප්‍රමාණය

### *1. සම්මන්ත්‍රණපුර*

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| **සම්මන්ත්‍රණපුර** | 1.2 | ශ්‍රී වික්‍රමපුර<br>සම්මන්ත්‍රණපුර | 4 | පිච්චමල්වත්ත<br>ගැමුණුපුර<br>ශ්‍රී වික්‍රමපුර<br>සම්මන්ත්‍රණපුර |

## 2 .මට්ටක්කුලිය

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| මට්ටක්කුලිය | 2.2km | හැදල තොටුපල පාර<br>මෝදර වීදිය<br>කාක දූපත පාර<br>ශාන්ත මරියා පාර<br>ප්‍රංශ වත්ත පාර<br>ශ්‍රී වික්‍රම මාවත<br>රුද්‍රිගු පෙදෙස<br>ශ්‍රි කල්‍යාණි ගංගාරාම මාවත<br>කදිරාන වත්ත<br>දෝ.එස්.ඩ් ප්‍රනාන්දු මාවත<br>විස්වයික් පාර<br>පල්ලිය පාර පටුමග<br>මල්වත්ත පටුමග<br>ෆර්ගියුෂන් පාර<br>ශාන්ත මරියා පටුමග<br>ෆාම් පාර<br>මුදලිදු ජෝන් රුද්‍රිගෝ මාවත<br>මැද පාර<br>සාවියා පාර<br>රාවත්ත පටුමග<br>ජුබිලි මාවත<br>කැළණිගග මෝල පාර | 7 | අලිවත්ත<br>රාවත්ත<br>මල්වත්ත<br>ප්‍රංශවත්ත<br>එකමුතුපුර<br>259 වත්ත<br>පොකුණුවත්ත |

## 3. මෝදර

| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| මෝදර | 80 | මෝදර වීදිය<br>රජමල්වත්ත පාර<br>අලුත් මාවත පාර<br>ධවලසිංහාරාම මාවත<br>මාදම්පිටිය පාර<br>පන්සල පාර<br>විස්ට් පැසේජ්<br>ශා ජොන් පටුමග<br>හේනමුල්ල පටුමග<br>හර්බට් පෙදෙස<br>කිඹුලා ඇල<br>දොස්තර ඇස්.ඩී.ප්‍රනාන්දු මාවත<br>ෆර්ගියුෂන් පාර<br>ශ්‍රී පඤ්ඤානන්ද මාවත<br>බ්ලුමැන්ඩල් පාර පීරිස් මාවත<br>මහවත්ත පාර<br>මුදලිදු ජෝන් රුද්‍රිගු මාවත | 61 | ශා.එල්මෝ පටුමග,<br>රජමල්වත්ත පටුමග,<br>ශා බ්‍රිජට් පටුමග,<br>බෝසන්ගහවත්ත<br>මෝදර වීදිය-<br>17,63,66,86,93,95,96,141,149,153,157,159,161,167,173,194,208,228,227,<br>ඇස්.ඩී.ප්‍රනානදු මාවත<br>27 වත්ත<br>ෆර්ගියුන් පාර<br>427 වත්ත<br>ශ්‍රී පඤ්ඤානන්ද මාවත<br>70,90<br>අලුත් මාවත පාර<br>737,819,881,895,941,610,614,622,664,702,726,792,796,838,844,854,<br>රජමල්වත්ත පාර 27,55,69<br>බ්ලුමැන්ඩල් පාර<br>796,802,821<br>මාදම්පිටිය පාර 27,99,126,129,146,147,158,164,170,<br>ධවලසිංහාරාම පාර 91,135,155 |

## 4 .මාදම්පිටිය

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| මාදම්පිටිය | 31 | මාදම්පිටිය පාර<br>ෆර්ගියුෂන් පාර<br>ධවලසිංහාරාම පාර<br>හේනමුල්ල පටුමග | O3 | 225 වත්ත<br>233 වත්ත<br>කජීමා වත්ත |

## 5. මහවත්ත

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| **මහවත්ත** | 58 | ෆර්ගියුෂන් පාර<br>මාදම්පිටිය පාර<br>ලූකස් පාර<br>මහවත්ත පාර<br>මහවත්ත<br>පටුමග<br>නාගලගම් වීදිය<br>සිරිමාවෝ<br>බණ්ඩාරනායක<br>මාවත<br>ජයන්ත<br>මල්ලිමරච්චි<br>වීදිය | 47 | වතු අංක 151, 203,221,215,229,233,239,203,245,250,38,40,44,64,124,279,285,30,859,312,314,462,361,33,35,75,95,357,369,381,391,18,60,64,74,92,97,118,111,151,169,175,177,225,231,236,240,211 |

## 6 . අලුත් මාවත

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| අලුත්මාවත | **55** | මුතුවැල්ල මාවත<br>මාදම්පිටිය පාර<br>දි ලාසාල් පාර<br>බ්ලූමැන්ඩල් පාර<br>සාන්ත ජේම්ස් පාර<br>අලුත්මාවත පාර | **31** | 328වත්ත<br>360 වත්ත<br>23 වත්ත<br>227 වත්ත<br>259 වත්ත<br>172 වත්ත<br>168 වත්ත<br>160 වත්ත<br>164 වත්ත<br>116 වත්ත<br>8587 වත්ත<br>75 වත්ත<br>242 වත්ත<br>228 වත්ත<br>224 වත්ත<br>208 වත්ත<br>560 වත්ත<br>522 වත්ත<br>452 වත්ත<br>442 වත්ත<br>412 වත්ත<br>94 වත්ත<br>106 වත්ත<br>104 වත්ත<br>80 වත්ත<br>59 වත්ත<br>68 වත්ත<br>57 වත්ත<br>47 වත්ත<br>37 වත්ත |

## 7. ලුණුපොකුණ

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| ලුණුපොකුණ | 115 | අලුත් මාවත පාර<br>සාන්ත අනඩ්‍රෙ ඉහළ පාර<br>සාන්ත අන්ඩ්‍රෙ පහළ පාර<br>රොක්හවුස් පටුමග<br>දි ලාසාල් වීදිය<br>අලි හවුස් පටුමග<br>අලි පටුමග<br>විද්‍යාල පටුමග<br>16 වෙනි පටුමග<br>සුමිත්‍රාරාම මාවත<br>ගුණානන්ද මාවත<br>පිකරින්ස් පාර<br>අල්විස් පාර<br>ගල්වල පාර<br>වාලස් පෙදෙස<br>17 වෙනි පටුමග<br>මොබ්බාරි පටුමග | 10 | 30l වත්ත,<br>385 වත්ත<br>323 වත්ත<br>යකඩ කොටු වත්ත<br>ආර්.බී.වත්ත<br>267 වත්ත<br>29 වත්ත<br>39 වත්ත<br>238 වත්ත |

## 8 .බ්ලූමැන්ඩල්

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| බ්ලූමැන්ඩල් | 77 | වෙල්ස් කුමාර පාර<br>ස්ටේඩියම් පාර<br>බ්ලූමැන්ඩල් පටුමග | 29 | 76 වත්ත<br>94 වත්ත<br>114 වත්ත<br>84 වත්ත<br>126 වත්ත<br>130 වත්ත<br>134 වත්ත<br>134 වත්ත,<br>139 වත්ත<br>82 වත්ත<br>74 වත්ත<br>185 වත්ත<br>322 වත්ත<br>391 වත්ත<br>419 වත්ත<br>397 වත්ත<br>240 වත්ත<br>407 වත්ත<br>34 වත්ත<br>6 වත්ත<br>7 වත්ත<br>5 වත්ත<br>186 වත්ත<br>200 වත්ත<br>220 වත්ත<br>230 වත්ත<br>400 වත්ත<br>478 වත්ත |

## 9. කොටහේන බටහිර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| කොටහේන බටහිර | 0.4 | ශ්‍රී ගුණානන්ද මාවත<br>විද්‍යාලය වීදිය<br>14 වන පටුමග<br>11 වන පටුමග<br>13 වන පටුමග<br>එසකිමුත්තු පටුමග<br>බෝධිරාජ මාවත<br>ගල්පොත පාර<br>ශිවානන්ද පාර<br>රාමනාදන් පාර<br>ජම්පටා වීදිය<br>ජම්පටා පටුමග<br>බොන්ජීන් පාර<br>ජෝර්ජ් ආර් ඩී සිල්වා මාවත<br>ජිනානන්ද මාවත<br>කොටහේන වීදිය<br>පිකරින්ස් පාර | 30 | රාමනාදන් පාර<br>වතු අංක 146,30<br>ජම්පටා වීදිය<br>වතු අංක<br>23,43,57,89,95,101,129,131,139,145,151,155,161<br>බොන්ජීන් පාර<br>වතු අංක 3<br>ජෝර්ජ් ආර් ඩී සිල්වා මාවත<br>වතු අංක 58,50<br>දාබරේ හෝටල් වත්ත<br>කොටහේන වීදිය - 85,.<br>පිකරින්ස් පාර - වතු අංක 175 ,222<br>විද්‍යාලය වීදිය - වතු අංක 100,92,96<br>ශ්‍රී ගුණානන්ද මාවත - වතු අංක 32,60,124,144,182 |

## 10. කොටහේන නැගෙනහිර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| කොටහේන නැගෙනහිර | 0.38km | ගලපොත වීදිය<br>මේ ෆීල්ඩ් පාර<br>සිරිල් සී පෙරේරා මාවත<br>මේ ෆීල්ඩ් පටුමග<br>වාසල පාර<br>පරමානන්ද විහාර මාවත<br>කොටහේන වීදිය | 16 | ගලපොත වීදිය වතු අංක 06 ,13<br>මේ ෆීල්ඩ් පාර වතු අංක 03, 65,<br>සිරිල් සී පෙරේරා මාවත වතු අංක 54,25,35<br>මේ ෆීල්ඩ් පටුමග වතු අංක 96,78,97,03<br>වාසල පාර වතු අංක 88,65<br>පරමානන්ද විහාර මාවත වතු අංක 63, 87, 103,<br>කොටහේන වීදිය වතු අංක 104 ,64 |

## 11. කොච්චිකඩේ උතුර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| **කොච්චිකඩේ උතුර** | 30 | නිව්හැම් චතුරශ්‍රය<br>සාන්ත අන්තෝනි මාවත<br>රත්නම් පාර<br>ජම්පටා වීදිය<br>විවේකානන්ද කන්ද පාර<br>ජින්තුපිටිය වීදිය<br>සාගර වීදිය<br>ශ්‍රී කදිරේසන් වීදිය<br>ආන්ඩිවාල් වීදිය<br>බ්‍රාස් ෆවුන්ඩර් වීදිය<br>ශ්‍රී රත්නජෝති සරවනමුත්තු මාවත<br>සාන්ත ජෝන්ස් වීදිය<br>සී බීච් වීදිය<br>කැලින් වීදිය<br>බෙන්ක්ෂෝල් වීදිය<br>සී බීච් පටුමග | 53 | නිව්හැම් චතුරශ්‍රය වතු අංක 44,53,74,85,125<br>සාන්ත අන්තෝනි මාවත වතු අංක 38,36,94,116,118<br>රත්නම් පාර වතු අංක 33,61,95<br>ජම්පටා වීදිය වතු අංක 26 ,28<br>විවේකානන්ද කන්ද පාර වතු අංක 55,111,137,30<br>ජින්තුපිටිය වීදිය වතු අංක 72<br>සාගර වීදිය වතු අංක 15,46,111,314,319,320,322,328,332,328,316,337<br>ශ්‍රී කදිරේසන් වීදිය වතු අංක 113,157,165,175,201,209,225,152<br>ආන්ඩිවාල් වීදිය වතු අංක 18,46,48,51,93,68<br>බ්‍රාස් ෆවුන්ඩර් වීදිය වතු අංක 46,162,186,178,156,182,158<br>ශ්‍රී රත්නජෝති සරවනමුත්තු මාවත වතු අංක 237,210,200,216 |

## 12 .ජින්තුපිටිය

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| | 17 | ජම්පටා වීදිය<br>ජින්තුපිටිය වීදිය<br>ආදුරුප්පු වීදිය<br>අලුත් හෙට්ටිවීදිය<br>විවේකානන්ද හිල් වීදිය,<br>ලෝගුර් වීදිය,<br>ආඩිවල් වීදිය,<br>මහා විද්‍යාල මාවත<br>සංසමිත්තා මාවත,<br>ඒ .ජී හීන් අප්පුහාමි මාවත | 43 | 99වතු මාර්ගය,103 වතු මාර්ගය,106වතු මාර්ගය,112වතු මාර්ගය,74වතු මාර්ගය,107 වතු මාර්ගය,107වතුවතු මාර්ගය,113වතු මාර්ගය, ,117වතුවතු මාර්ගය,123වතු මාර්ගය,125වතු මාර්ගය,129වතු මාර්ගය,135වතු මාර්ගය145වතු මාර්ගය,151වතු මාර්මාර්ගය,161වතු මාර්ගයවතු,128වතු මාර්ගය,142වතු මාර්ගය,156වතු මාර්ගය,168වතු මාර්ගය,170වතු මාර්ගය,174වතු මාර්ගය,184වතු මාර්ගය,100වතු මාර්ගය,80වතු මාර්ගය,90වතු මාර්ගය,94වතු මාර්ගය,120වතු මාර්ගය,136වතු මාර්ගය,173වතුරතු මාර්ගය,197වතු මාර්ගය,225වතුවතු මාර්ගය,247වතු මාර්ගය275 වතු මාර්ගය,16වතු මාර්ගය,24වතුවතු මාර්ගය,20වතු මාර්ගය,28වතු මාර්ගය,42වතු මාර්ගය,44වතු මාර්ගය,50වතු මාර්ගය,127වතු මාර්ගය,බෝධිරාජාරාම වතු මාර්ගය |

## 13 . මසංගස්වීදිය

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| මසන්ගස්වීදිය | 39 | මහාවිද්‍යාල මාවත | 22 | 210 වත්ත |
| | | මසන්ගස්වීදිය | | 24 වත්ත |
| | | අලූත් යොන් වීදිය | | 34 වත්ත |
| | | ගවුස් මොහිදීන් මාවත | | 32වත්ත |
| | | අලුත්කඬේ වීදිය | | 54 වත්ත |
| | | පරන යොන් වීදිය | | 310 වත්ත |
| | | රතන ජෝති සරවනමුත්තු මාවත | | 421 වත්ත |
| | | මධ්‍යම පාර | | 210 වත්ත |
| | | පලවන පල්ලිය පාර | | 186 වත්ත |
| | | හුසේනියාවීදිය | | 85 වත්ත |
| | | අබ්දුල් ජබාර් මාවත | | 135 වත්ත |
| | | සුමනතිස්ස මාවත | | 120 වත්ත |
| | | සංඝමිත්ත මාවත | | 104 වත්ත |
| | | ජම්පටා වීදිය | | 64 වත්ත |
| | | ග්‍රීන් ලේන් | | 216වත්ත |
| | | | | 144 වත්ත |
| | | | | 136 වත්ත |
| | | | | 126 වත්ත |
| | | | | 56 වත්ත |
| | | | | 24 වත්ත |
| | | | | 36 වත්ත |

## 14. නිව්බසාර්

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| | 10 | ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ<br>ග්‍රෑන්ඩ්පාස් පාර<br>ශ්‍රී සංඝරාජ මාවත<br>මෛත්‍රී බෝධිරාජ මාවත<br>ශ්‍රීමත් බණ්ඩාරනායක මාවත<br>ශ්‍රී සුමනතිස්ස මාවත<br>මෙසෙන්ජර් වීදිය<br>ජේතවන වීදිය<br>පරාක්‍රම වීදිය<br>සිරිමාවෝ බණ්ඩාරනායක මාවත | 12 | වතු අංක<br>104,229,34,167,181,252,29,249,6,180,132,<br>ඩී මෙල් වත්ත |

## 15. ග්‍රෑන්ඩ්පාස් උතුර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| ග්‍රෑන්ඩ්පාස් උතුර | 30 | සාන්ත ජෝසප් පාර<br>බෙත්තාරා පටුමග<br>මෝලවත්ත පාර<br>ගැමුණු පටුමග<br>ඩී වාස් පටුමග<br>ස්වර්ණ චෛත්‍ය පාර<br>අව්වල් සාවියා පාර<br>ස්ටේස් පාර<br>මහ කුමාරගේ මාවත<br>ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ පාර<br>ග්‍රෑන්ඩ්පාස් පාර | 27 | වතු අංක<br>**40,66,158,43,129,58,63,149,60,94,<br>155,99,80,135,65,13,78,58,48,125,<br>61,56,113,35,118,64,311** |

## 16 .ග්‍රෑන්ඩ්පාස් දකුණ

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ගම්/ පාරවල්/වීදි සංඛ්‍යාව | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|---|
| ග්‍රෑන්ඩ්පාස් දකුණ | 47 | 12 | ස්ටේස් පුර<br>දොස්තර බබාපුල්ලේ පෙදෙස<br>මාළිගාවත්ත පටු පාර<br>ග්‍රෑන්ඩ්පාස් පාර<br>බෙත්තාරාම මාවත<br>ලුක්මන්ජ් චතුරස්‍ර මාවත<br>බෝධිරාජ මාවත<br>ශ්‍රී සද්ධර්ම මාවත<br>බේස්ලයින් පටු පාර<br>දොස්තර ඩෙනිස්ටර් සිල්වා මාවත | 7 | ෆා<br>මසි වත්ත<br>70 වත්ත<br>585 වත්ත<br>192 වත්ත<br>180 වත්ත<br>ශ්‍රීමාපුර<br>විහාර පෙදෙස<br>මුවන්පැලැස්ස පටුමග<br>දුටුගැමුණු පටුමග |

## 17. නවගම්පුර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| නවගම්පුර | 10 | ස්ටේස් පාර<br>ග්‍රෑන්ඩ්පාස් පාර<br>19 වන පටුමග<br>අව්වල් සාවියා පාර | 6 | 15 වත්ත<br>185 වත්ත<br>44 වත්ත<br>20 වත්ත<br>19 වත්ත<br>17 වත්ත |

## 18. මාලිගාවත්ත නැගෙනහිර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| මාලිගාවත්ත නැගෙනහිර | 62 | දුම්රිය නිවාස පාර<br><br>ජුම්මා මස්ජිඩ් පාර<br><br>මල්ලිකාරාම පාර<br>දො. ඩැනිස්ටර් ද සිල්වා මාවත<br>මෛත්‍රී බෝධි විහාර මාවත<br>මාලිගාවත්ත පටුමග<br>ශ්‍රී සද්ධර්ම පාර<br>බෙත්තාරාම පන්සල පාර<br>පාසල් පටුපාර<br>දෙමටගොඩ පාර<br>ශාන්ත අන්තෝනි පාර<br>මල්ලිකාරාම පාර | 37 | වතු අංක<br>70, 38 ,84, 90, 26, 16, 91, 100, 30, 29, 12, 229, 11, 23, 359, 383, 364, 344, 132, 236, 222, 228, 180, 242, 206, 198, 168, 191, 415, 360, 334, 435, 433, 399, 389, 371, 377, |

## 19. මාලිගාවත්ත බටහිර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| මාලිගාවත්ත බටහිර | 16 | ජයන්ත වීරසේකර මාවත<br>මාළිගාවත්ත පාර<br>සෙවන හරස් පාර<br>පරිසර මාවත<br>ජේ.ඒ්.මිල්ටන් මාවත<br>රජ පොකුණ මාවත<br>ධර්මසිරි ගමගේ මාවත<br>සාවියා පල්ලිය පාර<br>නව ප්‍රදීපා මාවත<br>කලෛයි මගල් මාවත<br>භාරති මාවත<br>සෙන්පති මාවත<br>රම්‍යා පෙදෙස<br>එච්.ආර්.ජෝතිපාල<br>පාසැල් පටුමග පාර<br>දෙමටගොඩ පාර<br>කුරෛරයිෂානි මවුලිනා මාවත | 4 | පාසල් පටුමග<br>දෙමටගොඩ පාර<br>සාවියා පල්ලිය පාර<br>කුරෛරශානි මෞලානා පාර |

## 20. බෙත්තාරාම

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| බෙත්තාරාම | 24 | සංඝරාජ මාවත<br>ප්‍රදීපා මාවත<br>ජුම්මා මස්ජිඩ් පාර<br>මාලිගාවත්ත පෙදෙස<br>211 මහල් නිවාස පාර,<br>නුරාණියා මහල් නිවාස පාර<br>සෙබස්තියන් ඇළ පාර<br>සමාධි මාවත<br>බාරොන් ජයතිලක විද්‍යාල පාර | 27 | 3වත්ත,15වත්ත,<br>27වත්ත,33වත්ත,<br>37වත්ත, 26වත්ත,88වත්ත,151වත්ත,RBවත්ත,<br>151වත්ත,157වත්ත,159වත්ත,120වත්ත,121වත්ත,323වත්ත,315වත්ත,263වත්ත,<br>255වත්ත,249වත්ත,211වත්ත,175,173වත්ත,165වත්ත,181වත්ත,199වත්ත,211Tවත්ත,189වත්ත |

## 21. අලුත්කඩේ නැගෙනහිර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සං ඛ්‍යා ව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| අලුත්කඩේ නැගෙනහිර | 16 | ශ්‍රීමත් බන්ඩාරනායක මාවත<br>අබ්දුල් හමීඩ් වීදිය<br>මීරානිය වීදිය<br>කුමාර වීදිය<br>බෙල්මන්ට් වීදිය<br>විල්සන් වීදිය<br>මොහිදින් මස්ජිඩ් පටු පාර<br>සංඝරාජ මාවත<br>ඔයිල්මන් වීදිය<br>හිල් කාසල් වීදිය<br>පරන යොන් වීදිය<br>මිල් වීදිය | 39 | වතු අංක 137/123/107/91/<br>81/206/192/180/<br>166/143/146/75/<br>95/111/41/87/257/251/247/237/235/189/181/167/161/149/127/112/98/12/50/43/51/230/222/21/<br>248/214/225/ |

## 22. අලුත්කඩේ බටහිර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| අලුත්කඩේ බටහිර | 15 | වේල්ල වීදිය<br>සුචරිත මාවත<br>පිර්සයිබු වීදිය<br>ශ්‍රීමත් බණ්ඩාරනායක මාවත<br>මිහිදු මාවත<br>අළුත්කඩේ වීදිය<br>හිල්කාසල් පෙදෙස<br>මිරානියා වීදිය<br>ශාන්ත සෙබස්තියන් වීදිය<br>පරන යොන් වීදිය<br>අබ්දුල් හමීඩ් වීදිය<br>සිල්ව ස්මිත් පටු පාර | 107 | 66 වත්ත<br>152 සිට 248 වතු<br>42 වත්ත<br>1 සිට 7 වතු<br>34 වත්ත<br>117 වත්ත |

## 23. පිටකොටුව

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| පිටකොටුව | 77 | 1 හරස් වීදිය<br>2 හරස් වීදිය<br>3 හරස් වීදිය<br>4 හරස් වීදිය<br>5 හරස් වීදිය<br>6 හරස් වීදිය<br>1 රෝහිණී පටුමග<br>2 රෝහිණී පටුමග<br>කෝසල විදිය<br>මයුරි වීදිය<br>කුමාර වීදිය<br>කෛයිසර් වීදිය<br>බංගසාල වීදිය<br>අබ්දුල් කාදර් මාවත<br>බෝධිරාජරාම අඩි සි◌යය පාර<br>බෝධිරාජාරාම පාර<br>මැලිබන් වීදිය<br>මල්වත්ත පාර<br>ඕල්කට් මාවත<br>ගෑස් කර්මාන්ත වීදිය<br>වෙල්ල වීදිය<br>කෙලින් වීදිය<br>සෙ◌ාන්ඩර්ස් වීදිය<br>චීන වීදිය | 03 | කෝසල ලේන්<br>රෝහිණී ලේන්<br>මයුරි ලේන් |

## 24 .කොටුව

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| කොටුව | 3.06 | ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනල් මාවත<br>ජනාධිපති මාවත<br>රෝහල් වීදිය<br>ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත<br>ඩියුක් වීදිය<br>ලෝටස් පාර<br>ලංකා බැංකු මාවත<br>චැතම්වීදිය<br>යොර්ක් වීදිය<br>ලේඩන් බැස්ටියන් මාවත<br>චෛත්‍ය පාර<br>කැනල් රෝඩ්<br>මුදලිගේ මාවත<br>බ්‍රිස්ටල් වීදිය<br>ඩී.ආර්.විජේවර්ධන මාවත | නැත | - |

## 25 .කොම්පඤ්ඤවීදිය

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| කොම්පඤ්ඤ වීදිය | 5.5 | මැලේ වීදිය<br>කුමාර රත්නම් පාර<br>හෙන්රි ඩී මෙල් මාවත<br>නිව් ෆෙරි පටුමග<br>පරණ ෆෙරි පටුමග<br>මියුස් වීදිය<br>ජස්ටිස් අක්බාර් මාවත<br>ගව්ල්ඩීන් විදිය<br>අලුත් තොටුපල පාර -<br>වෙලන්ස් පැසෙජ් -<br>ග්ලේනි වීදීය | 19 | 21 වත්ත<br>16 වත්ත<br>25 වත්ත<br>23 වත්ත<br>55 වත්ත<br>21 වත්ත<br>27 වත්ත<br>11 වත්ත<br>74 වත්ත<br>62 වත්ත<br>60 වත්ත<br>46 වත්ත<br>20 වත්ත<br>159 වත්ත<br>122 වත්ත<br>112 වත්ත<br>98 වත්ත<br>86 වත්ත<br>22 වත්ත |

## 26. හුණුපිටිය

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| හුණුපිටිය | 71 | චෝක්ෂොල් පටුමග<br>චෝක්ෂෝල පටුමග<br>ඩෝසන් වීදිය<br>කිවි පාර<br>මෝර්ගන් පාර<br>යූනියන් පාර<br>කිච් පැච් පාර<br>පොලිස් පටුමග<br>බිරූජතුල් අස්රාජ් පටුමග<br>මුරුගන් පටුමග<br>බරක්කා පටුමග<br>කුමාර රත්නම් පටුමග | 42 | වතු අංක 15,25,33,41,56,<br>90,98,101,104<br>134,163,193,28,34,44,31,50,41,62,68,45,52,44,60,66,102,112,<br>128,232,256,37,14,55,81,91,111,131,141,155,59,93,94 |

## 27. සුදුවැල්ල

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| සුදුවැල්ල | 13 | ඩාර්ලි පාර<br>ඩීන්ස් පාර<br>ඩී.ආර්.විජේවර්ධන මාවත<br>ආර්නෝල්ඩ් රත්නායක මාවත<br>විනයාලංකාර මාවත<br>දේවානම්පියතිස්ස මාවත<br>කෝවිල වීදිය<br>ෆෝබස් පටුමග | 20 | වතු අංක 319,345,415,<br>421,11,340,25,<br>55,127,32,437,<br>47,68,,86,108,<br>32,156,266,<br>284,375 |

## 28. කෙසෙල්වත්ත

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| කෙසෙල්වත්ත | 20 | ශ්‍රී සංඝරාජ මාවත<br>අධිකාරම් මාවත<br>මිහිඳු මාවත<br>සාන්ත සෙබස්තියන් පාර<br>ඔල්කොට් මාවත<br>මීරානියා පාර<br>විල්සන් පාර<br>බේරේ පාර<br>උසාවිය පාර<br>ස්මිත් පාර<br>බැල්මන්ට් පාර<br>අක්බාර් පටුමග<br>ගෝමස් පටුමග<br>මාටිස් පටුමග<br>මුහන්දිරම් පාර<br>මුහන්දිරම් පටුමග<br>සාංචි ආරච්චි වත්ත<br>ලොක්ගේට් පටුමග<br>ශ්‍රී ප්‍රියදර්ශන මාවත | 33 | ශ්‍රී ප්‍රියදර්ශන මාවත වතු අංක 20,24,29,53,83,41<br>සාන්ත සෙබස්තියන් පාර වතු අංක 03,05,07,09,13<br>අක්බාර් පටුමග වතු අංක 17,19,21,25,31,33,35,36,46<br>මාටිස් පටුමග වතු අංක 08,14,32,36,46<br>මුහන්දිරම් පාර වතු අංක 19,41,42<br>මුහන්දිරම් පටුමග වතු අංක 14,11,09<br>සාංචි ආරච්චි වත්ත වතු අංක 54<br>ශ්‍රී සංඝරාජ මාවත වතු අංක 119 |

## 29 .පංචිකාවත්ත

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| පංචිකාව ත්ත | 34 | ශ්‍රී සංඝරාජ මාවත. ජයන්ත වීරසේකර මාවත මරදාන පාර පංචිකාවත්ත පාර | 40 | වතු අංක 143,155,165,173,175,177,197,201,207,70,72,74,156,168,196,202,111,51,61,75,97,105,111,141, 145,175,110,132,150,158,198,125,56,72,104,140,162, 61, 6,7 |

## 30. මාළිගාකන්ද

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| මාලිගාකන්ද | **29** | මරදාන පාර<br>ශ්‍රී වජිරඥාණ මාවත<br>දෙමටගොඩ පැසේජ්<br>කුරේයිෂනි මවුලානා පටුපාර<br>ජලාශය පාර<br>මාළිගාකන්ද පාර<br>ගොස්පල් පටු පාර<br>ක්ලිෆ්ටන් පටු පාර | **31** | වතු අංක 33,41,91,97,101,131,141,159, 181,189,205, 207,217,225, 67,85,75,138, 159,162,194, 198,204,205, 266,274,255, 257,298 |

## 31. මරදාන

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| මරදාන | 60 | ටී.බී.ජායා මාවත<br>සමන් අබේගුණරත්න මාවත<br>කේ.ඩී.ඩේවිඩ් මාවත<br>පියදාස සිරිසේන මාවත<br>විපුලසේන මාවත<br>එස් මහින්ද මාවත<br>දේවානම්පියතිස්ස මාවත<br>ඩීන්ස් පාර<br>දෙවන හරස් මග, මරදාන<br>මරදාන පාර | 15 | විපුලසේන මාවත වතු අංක 25, 51<br>පියදාස සිරිසේන මාවත වතු අංක 49<br>දේවානම්පියතිස්ස මාවත වතු අංක 23,119,133,141,149,163,177<br>ඩීන්ස් පාර වතු අංක 28,33,36,37,44,53, 72,101,111, 115,122,123, 181<br>මරදාන පාර<br>වතු අංක 528<br>එස් මහින්ද මාවත වතු අංක 43,73,32,90 |

## 32. ඉබ්බන්වල

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| ඉබ්බන්වල | 60 | යූනියන් පෙදෙස<br>ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත<br>බ්‍රේබ්‍රෑක් වීදිය<br>හුණුපිටිය වීදිය<br>වැව පාර<br>හුණුපිටිය පාර<br>ලේක් ක්‍රසෙන්ට් පාර<br>ලිලි පාර<br>සර් ජේම්ස් පීරිස් මාවත<br>ඩීන්ස් පාර<br>ශ්‍රී අනගාරික ධර්මපාල මාවත<br>ෆොස්ටර් පටුමග<br>ෆවුන්ඩන් හවුස් පටුමග<br>හෙඩ්ජස් කෝට් පටුමග<br>හයිඩ් පාක් කෝනර්<br>නොරිස් කැනල් පාර<br>පාක් වීදිය<br>විපුලසේන මාවත<br>විනයාලංකාර මාවත<br>ජ්.බඩ්.පෙරේරා මාවත | 7 | 84 වත්ත<br>76 වත්ත<br>92 වත්ත<br>111 වත්ත<br>101 වත්ත<br>14 වත්ත<br>281 වත්ත |

## 33. වැකන්ද

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| වැකන්ද | 25 | සර් ජේම්ස් පීරිස් පාර<br>ජස්ටිස් අක්බාර් පාර<br>පෙරහැර පාර<br>ස්ටුවට් වීදිය<br>ඩිස්පෙන්සරි පාර<br>සොන්ඩර්ස් කෝට්<br>විතානගේ පාර<br>පල්ලිය වීදිය<br>වැකන්ද පාර<br>නවම් මාවත | 33 | විතානගේ පාර වතු අංක 16,58,63,66, 70,71,77,78,83,84,88,89,92,94,100,102<br>පල්ලිය වීදිය වතු අංක 47,55,185<br>සොන්ඩර්ස් කෝට් වතු අංක 21,47,59<br>ස්ටුවට් වීදිය වතු අංක 15,35,55,10,16,22,20,26,34,42<br>නවම් මාවත - ලොන්ඩරි වත්ත |

## 34. කොච්චිකඩේ දකුණ

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදි/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| කොච්චිකඩේ දකුණ | 0.65km | ගුණසිංහපුර පාර<br>ඩයස් පෙදෙස<br>අක්බර් පටුමග<br>බෙරේ පාර<br>පයිස් පෙදෙස<br>සොන්ඩර්ස් පෙදෙස<br>සාන්ත සෙබස්තියන් පාර<br>මධ්‍යම පාර<br>ගවුස් මොහිදීන් පාවත<br>වෙල්ල විදිය<br>පරණ යෝනක වීදිය<br>අලුත් යෝනක වීදිය<br>උම්බිච්චි පෙදෙස<br>වුල්වන්දාල් විදිය | 34 | 25 වත්ත<br>26 වත්ත<br>28 වත්ත<br>31වත්ත<br>32 වත්ත<br>37 වත්ත<br>45 වත්ත<br>51 වත්ත<br>53 වත්ත<br>54 වත්ත<br>61 වත්ත<br>66 වත්ත<br>75 වත්ත<br>85 වත්ත<br>83 වත්ත<br>93 වත්ත<br>97 වත්ත<br>104 වත්ත<br>109 වත්ත<br>101 වත්ත<br>111 වත්ත<br>116 වත්ත<br>134 වත්ත<br>139 වත්ත<br>218 වත්ත<br>248 වත්ත<br>258 වත්ත<br>263 වත්ත<br>265 වත්ත<br>269 වත්ත<br>283 වත්ත<br>289 වත්ත<br>299 වත්ත |

## 35. ගාලුමුවදොර

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්.) | ප්‍රධාන වීදී/ වතු /පාරවල්වල නම් | වතු සංඛ්‍යාව | වතු අංකය හෝ නම |
|---|---|---|---|---|
| ගාලුමුවදොර | 44 | ජස්ටිස් අක්බාර් මාවත<br>මොහමඩ් බාකීර් මාකාර් මාවත<br>අහමඩ් පටුමග<br>ග්ලීන් පෙසෙජ්<br>චෙපල් පටුමග<br>පල්ලිය පටුමග<br>ගාලු පාර | 5 | 52 වත්ත<br>40 වත්ත<br>18 වත්ත<br>160 වත්ත<br>170 වත්ත |

# උතුරු කොළඹ හා මැද කොළඹ ග්‍රාම නිලධාරී කොට්ඨාස බෙදී ඇති අයුරු

## උතුරු කොළඹ

1. කොටහේන බටහිර
2. අලුත්මාවත
3. ලුණුපොකුණ
4. මහවත්ත
5. මට්ටක්කුලිය
6. මෝදර
7. බ්ලූමැන්ඩල්
8. කොටහේන නැගෙනහිර
9. මාදම්පිටිය
10. සම්මන්ත්‍රණපුර

## මැද කොළඹ

1. පිටකොටුව
2. කොටුව
3. හුණුපිටිය
4. කොච්චිකඩේ දකුණ
5. කොම්පඤ්ඤවීදිය
6. ජින්තුපිටිය
7. ගාලුමුවදොර
8. කොච්චිකඩේ උතුර
9. ඉබ්බන්වල
10. මාලිගාකන්ද
11. වැකන්ද
12. සුදුවැල්ල
13. කෙසෙල්වත්ත
14. පංචිකාවත්ත
15. මරදාන
16. ග්‍රෑන්ඩ්පාස් උතුර
17. ග්‍රෑන්ඩ්පාස් දකුණ
18. මාලිගාවත්ත නැගෙනහිර
19. මාලිගාවත්ත බටහිර
20. නවගම්පුර
21. බෙත්තාරාම
22. අලුත්කඩේ බටහිර
23. අලුත්කඩේ නැගෙනහිර
24. මසංගස්වීදිය
25. නිව්බසාර්

## ගමේ නම සෑදි ඇති ආකාරය පිළිබඳ පුරා වෘත්තය (තෝම්බුව )

| ග්‍රාම නිලධාරි වසම | පුරාවෘත්තය |
|---|---|
| ගාලුමුවදොර | ගොල්ෆේස් පිට්ටනියට ඉතා දිගු ඉතිහාසක් පවති.මෙය ඉතා අතීතයේ වධකාගාරයක් වු බවට ඉතිහාසය සාක්ෂි දරයි. ඒම නිසා ගාලුමුවදොර ලෙස හැදින්වේ. |
| බෙත්තාරාම | බෙත්තාරාම ග්‍රාමයේ වු ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රිඩාංගණය හෙවත් බෙත්තාරාම ක්‍රිඩාංගනය නිසා මෙම ග්‍රාමය ජාත්‍යන්තරය පුරා ජනප්‍රිය විමට හේතු විය. |
| අලුත්කඩේ බටහිර | යටත් විජිත සමයේ කොළඹ ඉදිකිරිම් සඳහා වරාය දුම්රිය මාර්ග ආදිය සඳහා වෙනත් ප්‍රදේශවලින් ගෙනා කම්කරුවන්ගේ හතර වන පස්වන පරම්පරාවල පුද්ගලයන් දැනට ජිවත් වේ. |
| කොම්පඤ්ඤවිදිය | බ්‍රිතාන්‍ය සමයේ මෙරට ආරම්භ වු පෞද්ගලික ව්‍යාපාර (කොම්පැණි)Ceylon cold stores.(වර්තමානයේ එළිෆන්ට් හවුස්) වැනි ව්‍යාපාර මෙම ප්‍රදේශයේ බහුලව පැවති නිසා කොම්පැනි විදිය යන්න පසුව කොම්පඤ්ඤවිදිය නම් විය. ඉංග්‍රිසීන් මෙය Slave Island ලෙස හැදින්වුයේ එකළ ඔවුන් විසින් වෙනත් රටවලින් මෙහෙකාර සේවයට රැගෙන ආ වහලුන් ( Slaves) මුහුදු මාර්ග ඔස්සේ බෝට්ටු මගින් රැගෙන විත් මෙම ප්‍රදේශයේ රඳවා තිබු නිසා ඔවුන් මෙම ප්‍රෙද්ශය Slave Island ලෙස හැදින්විය. |
| සම්මන්ත්‍රණපුර | ශ්‍රි වික්‍රම රාජසිංහ රජු සිරභාරයට ගෙන නුවර සිට රැගෙන ගොස් ඇත්තේ මෙම වසමේ පාරේ ය. ඒ අනුව වික්‍රමපුර නම් පෙදෙසක් ඇතිවිය. |
| මාලිගාවත්ත නැගෙනහිර | අතිතයේ මාලිගාවත්ත ග්‍රාමයේ වැසියන් ජිවනෝපාය ලෙස කෘෂිකර්මාන්තයේ නියැලුන බවද කිර කොටු වගාකර ඒවා වෙළදාම් කරගෙන ජිවත් වු බව ඓතිහාසික පුරාවෘත්තයෙන් පැහැදිලි වේ. |
| මහවත්ත | යටත්විජිත කාලයට පෙර සිටම මෙම ස්ථානය භාණ්ඩ ප්‍රවාහනය පිළිබඳ වැදගත් ස්තානයක් බැවින් මෙහි ඓතිහාසික වැදගත්කමක්ද වේ.<br>වසර 60 ක පමණ කාලයක සිට වෙසක් පොහොය නිමිති කරගෙන ඉදිකරනු ලබන වෙසක් තොරණ හේතුවෙන් ද ගමට ප්‍රසිද්ධියක් ලැබිම වැදගත්කමක් ද වේ.බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ වික්ටෝරියා රැජින ඉදිකළ වික්ටෝරියා පාලම හේතුවෙන් ද ගමට ප්‍රසිද්ධියක් එක් වි ඇත. |

| | |
|---|---|
| **මරදාන** | මෙම ප්‍රදේශය සඳහා අතිතයේ භාවිතා වුයේ මරියකඩේ යන නාමයයි.ඊට හේතුව වුයේ Moor (Marrikkar) වරුන්ට අයත් වෙළඳසැල් මෙමම ප්‍රදේශයේ පිහිටා තිබු නිසාවෙනි.වෙළඳාමට අමතරව සෑම ප්‍රදේශයකම ජනතාව නිතර දෙවෙලේ ආ ගිය ප්‍රදේශයක් වු නිසා මෙම ප්‍රදේශය ඉතා කා ර්ය බහුල ජනාකිර්ණ ප්‍රදේශයක් විය. ඒ නිසාවෙන්ම එවකට පැවති නිති විරෝධි මත්ද්‍රව්‍ය මත්පැන් ගංජා , රා ,කසිප්පු, මෙම ප්‍රදේශයේ බහුලව භාවිතා විය.එබැවින් චන්ඩ්ින් මැරවරුන් (Thu8gs and gang rubbers) බහුලව ගැවසුණු ප්‍රදේශයකි. මේ නිසා රටේ වෙනත් ප්‍රදේශවල පුද්ගලයන් මෙම ප්‍රදේශය කෙරෙහි පහත් ලෙස සැලකිමට පුරුදුව සිටියේය.එපමණක් ද නොව එකල මෙම ප්‍රදේශය අපරාධ සඳහා නම ගිය ප්‍රදේශයක් විය. එමෙන්ම මෙම වෙළඳුන් අතර මරියා නැමැති කාන්තාව ඉතා ප්‍රසිද්ධ චරිතයක් විය .මේ අනුව මැරවරයන් බහුල වූ ප්‍රසිද්ධ මරියා නමැති කාන්තාව සිය ආධිපකත්‍යය ගොඩනගා ගෙන තිබු මරික්කාර්වරුන්ගේ වෙළඳ බල ප්‍රදේශය අද මරදාන ලෙසින් හැඳින්වේ. |
| **මාළිගාකන්ද** | සිතාවක I වන රාජසිංහ රජතුමාගේ පාලන සමයේ මෙරට මුහුදුබඩ ප්‍රදේශ පෘතුගිසි පාලනයට නතුවීමේ මුලාරම්භක වකවානුවයි . 1505 දි පෘතුගිසි ආගමනයක් සමඟ රට තුළ සෙසු ප්‍රදේශ වලද පැවතියේ රාජ්‍යත්වය උදෙසා අරගල කළ වකවානුවකි .රණශුරයකු වු රාජසිංහ රජතුමා පෘතුගිසින්ගේ ඇති විය හැකි අන්තරාය පිලිබඳ සලකා බලා අද මාලිගාකන්ද ලෙස හඳුන්වන මෙම ප්‍රදේශය තාවකාලික රැදවුම් මධ්‍යස්ථානයක් (ලැගුම්හලක්) ලෙස නිර්මාණය කරන්නට තිරණය කරන ලදි. එකළ මෙම ප්‍රදේශය තරමක උස්බිමක් ලෙස තිබි ඇති අතර ඒ අනුව එම උස්බිම තාවකාලික බලකොටුවක් ලෙස එදා ආරක්ෂිත උපක්‍රමයක් ලෙස සේනා සංවිධානය කරමින් රැකවල්ලා සිටින ලදි. එහිදි ආරක්ෂිත දියඅගල් උමංමාර්ග පවා නිර්මාණය කර තිබි ඇත. රජුගේ බල කොටුව තිබු ප්‍රදේශය රජ මාලිගය හා අර්ථයෙන් මාලිගාකන්ද ලෙස පසුකාලිනව ජනතාව ව්‍යවහාර කරන්නට විය. |
| **හුණුපිටිය** | හුණුගල් කර්මාන්තයේ යෙදුණු මිනිසුන් සිටින ස්ථානයක් අතීතයේ පැවතුනු බැවින් හුණුපිටිය යන්නෙන් අදහස් වේ. |
| **පිටකොටුව** | පිටකොටුව ආශ්‍රිත ප්‍රදේශය තුල පිහිටා ඇති කයිමන් දොරකඩ ඉතා ඓතිහාසික වටිනාකම් ඇති ස්මාරකයකි.එකල කොටුවට ඇතුලුවන ප්‍රධානතම දොරටුව මෙයයි.මේ අසල ඇති විශාල සණ්ටාරයේ දොරටුව විවෘත කිරිම සහ වසා දැම්ම උදෙසා කළ බවට පැවසෙයි.එසේම කයිමන් දොරකඩ ඇති මෙම සණ්ඨාරය කොට්ටේ රාජධානියේ දළදා මාළිගාවට අයත්ව තිබු එකක් බවටත් ජනප්‍රවාදයේ පවති .එසේම පිටකොටුව වර්තමාන මල්වත්ත ආශ්‍රිත ප්‍රදේශයේ තැන් තැන්වල බිම අතුරා ඇති කුට්ටි කලු ගල් එකළ ඉසුරුමත් කොට්ටේ රාජධානියේ ගොඩනැගිලිවලින් ගළවාගෙන අලුත් යොදාගෙන සකස් කරන ලද බවට ද මතවාදයක් පැවතිය.එසේම පළමුවන පිටකොටුව 06 වන හරස් විදිය දක්වා වු හරස් විදි එකල ලන්දේසි සමයේ වරායට භාණ්ඩ ප්‍රවහනයට භාවිතා කරන ලද කුඩා ඇළ මාර්ග ලෙසට ද ඇතැම් තැන්වල වාර්තා වේ.<br><br>පෘතුගීසින් විසින් ඉදිකරන ලද බල කොටුව ආශ්‍රිත ප්‍රදේශය කොටුව ලෙසත් ඉන් ඔබ්බෙහි වු මෙම කුඩා බිම් ප්‍රදේශය පිටකොටුව ලෙසත් හඳුන්වා තිබේ. |
| **මසංගස්විදිය** | මසංගස්විදීය පැවති නිසා පසුකාලිනව මසංගස්විදීය යන්නෙන් හඳුන්වයි |
| **ඉබ්බන්වල** | ඉබ්බෝ සිටි නිසා ඉබ්බන්වල යන්නෙන් හඳුන්වයි. |

| | |
|---|---|
| **කොටහේන නැගෙනහිර වසම** | උතුරු දිශාවෙන් බ්ලූමැණ්ඩල් වසමෙන්ද දකුණු දිශාවෙන් ජින්තුපිටිය වසමෙන්ද නැගෙනහිර දිශාවෙන් නිවුහසාර් වසමෙන්ද බටහිර දිශාවෙන් කොටහේන බටහිර වසමෙන්ද වටවු කොටහේන නැගෙනහිර වසම කොටහේන කොට්ඨාසයෙහි පිහිටා ඇත.එබැවින් මෙම වසමටද නම ලැබී ඇතිතේ ඉහත කොටහේන බටහිර වසමට නම ලැබී ඇති ආකාරයටමය.<br>අතීතයේ ඉතා සුන්දර ප්‍රදේශයක්ව පැවති මෙම භූමි භාගය තුල 1976 ලන්දේසි පාලන යුගයේදි ශාන්ත ලූසියා දෙව් මැදුර පොල් අතු මඩුවකින් ආරම්භ කරන ලදුව, 1937 බ්‍රිතාන්‍ය සමයේදී නවීකරණය කර මේ වන විට කොළඹ නගරය තුල පිහිටා ඇති විශාලතම දේවස්ථානය බවට පත්ව ඇත.මෙහි ඉදිකිරීම් ගෘහනිර්මාණ ශිල්පීන් වන්නේ රෙනෙසස් සහ බාරොන් යන අය වේ. |
| **කොටහේන බටහිර වසම** | උතුරු දිශාවෙන් ලුණුපොකුණ වසමෙන්ද දකුණු දිශාවෙන් කොච්චිකඩේ වසමෙන්ද නැගෙනහිර දිශාවෙන් ජින්තුපිටිය වසමෙන්ද බටහිර දිශාවෙන් මහ මුහුදින්ද වටවු කොටහේන බටහිර වසම ඉතා දීර්ඝ ඉතිහාසයක් ඇති ස්ථානයකි.මෙම නමෙහි අර්ථය දෙස බැලූ කල " කොටන් වලින් පිරුණු හේන" යන අර්ථයෙන් කොටහේන වී ඇති බව ව්‍යවහාරයේ දැක්වේ.<br>අතීතයේදී මෙම ප්‍රදේශය ඉතා සුන්දර වාසභූමියක්ව පැවති නමුත් පසු මෙම ප්‍රදේශය වෙරළ නගරයකි බවට පත්විය.ඉන් අනතුරුව සංකීර්ණ නාගරික ප්‍රදේශයක් බවට පත්විය.කොළඹ යුගයේදී ආගමන පුනර්ජීවන කටයුතුවලට දායක වූ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් වැඩසිටි දීපදුත්තාරාමය පිහිටා තිබෙන්නේද මෙම වසමේ වීම අප ලද භාග්‍යක් සේ සලකමු. |
| **නවගම්පුර** | ගම් නවයක ප්‍රජාව පදිංචියට පැමිණ ඇත .පසුව එය **නවගම්පුරය** නමින් හඳුන්වන ලදි. |
| **ලුණුපොකුණ** | වෙරළබඩ ආසන්නයේ ඇති ගමක් හේතුවෙන්ද ලුණු ජලය තැන් තැන්වල එකතු විමෙන් ලුණුපොකුණ නාමය නිර්මාණය වි ඇත. |
| **ජින්තුපිටිය** | පෘතුගීසින් විසින් මෙම ප්‍රදේශයේ මිනිසුන් ආගම නොඅදහන අය ලෙස එනම් ජිනේටෝ හැදින්විය. එය ජින්ටෝවරු ජිවත්වන ප්‍රදේශය ලෙස නම් කළ අතර පසු භාවිතයේදී ජින්තුපිටිය බවට පත්ව ඇත. |
| **නිව්බසාර්** | මුස්ලිම් වෙළදුන් විසින් මෙහි වෙළදාම් කරගෙන යන අතරතුර එතනට පැමිණි ඕලන්ද සෙනවියකුට බස්සේකුගේ නාදයක් ඇසිණි. එය අසා නිව් බස්සා යන නාමය යෙදිණි. පසු කාලයකදි එය නිව් බසාර් ලෙස හැදින්විය. |
| **ග්‍රෑන්ඩ්පාස් උතුර** | බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී පාලකයන් විසින් ව්‍යවහාර කරන ලද ග්‍රෑන්ඩ්පාස් නාමය පසු කාලයේදි භාවිතයට ගැනුණි. |
| **ග්‍රෑන්ඩ්පාස් දකුණ** | බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී පාලකයන් විසින් ව්‍යවහාර කරන ලද ග්‍රෑන්ඩ්පාස් නාමය පසු කාලයේදි භාවිතයට ගැනුණි |
| **කොච්චිකඩේ උතුර** | ඉන්දියානු (කෝච්චි) ජාතින්ගේ සංක්‍රමණය සමග පැමිණි නමකි. |

| | |
|---|---|
| **වැකන්ද** | බේරේ වැව් කන්ද ආශ්‍රිතව වැව් කන්ද පසුව වැකන්ද බවට  පත් විය. |
| **මාලිගාවත්ත බටහිර** | රාජසිංහ රජතුමාගේ  මාලිගාවේ වත්ත , මාලිගාවත්ත බවට  පත්විය. දැනට ද රජ පොකුණ ලෙස නාන ළිදක් ඇත.  මෙය රජතුමා ස්නානය කල පොකුණ ලෙස ජනප්‍රවාදයේ ඇත.  වර්තමනයේ මෙය නාන ළිඳක් ලෙස මිනිසුන් භාවිත කර ඇත. |
| **මාදම්පිටිය** | මාදම්පිටිය ගස්වලින් පිරි පැවතුණ ස්ථානය පසුකාලීනව මාදම්පිටිය නමින් ප්‍රසිද්ධ විය. |
| **අලුත්කඩේ නැගෙනහිර** | මෙම ගම්මානය තරමක් උස්වූ භූමි ප්‍රදේශයක පිහිටා ඇති බැවින් ලන්දේසි පෘතුගීසි යටත් විජිත කාලයේ පටන් අලුත්කඩේ නැගෙනහිර වශයෙන් හඳුන්වන බවට සැලකේ. |
| **පංචිකාවත්ත** | පංචවරු නමින් හැඳින්වූ ජන කොට්ඨාශයක්  ජීවත්ව සිටි හෙයින් පංචවරුන්ගේ නමින් හැඳින්වූ වත්ත  පසු කාලීනව එම ප්‍රදේශය පංචිකාවත්ත නමින් ජනප්‍රවාදයට එකතු විය. |
| **සුදුවැල්ල** | සුද වැලි පොළවක් තිබුණු නිසා සුදුවැල්ල යන නම සෑදුන බව දැනගන්නට ලැබී ඇත. |
| **කොටුව** | පරංගි ජාතිකයින් කුරුඳු වගා කිරිමට ලණුවක් දිගහැර කොටුවක් නිර්මාණය කර ගන්නා ලදී. පසුව එම වපසරිය තුප බල කොටුවක් නිර්මාණය කර ගන්නා ලදී. මෙම බල කොටුව ආශ්‍රිත ප්‍රදේශය වර්තමානයේ කොටුව ලෙසින් හඳුන්වනු  ලබයි. |
| **මහවත්ත** | කැළණි ගඟට මායිම්ව පිහිටි මහවත්ත ග්‍රාමයේ නාමය ඇති වූ ආකාරය පිළිබඳව නොයෙකුත් ප්‍රවාද පවතී. සමහරක් අලංකාර රසවත් ප්‍රවාදම වන අතර ඉන් පිළිගත හැකි ආකාරයේ ප්‍රවාද ද්විත්වයක් මෙලෙස ඉදිරිපත් කල හැකිය.  එකල යටත් විජිත යුගයේ මීගමුව සහ කොළඹ යා කරනු ලැබූ සුප්‍රසිද්ධ පාරු පාලම පිහිටි ප්‍රදේශය මෙම මහවත්ත ග්‍රාමයයි. එනම් වර්තමාන තොටළඟ ප්‍රදේශයයි. එකළ මේ පාරු පාලම විවෘතව පැවතියේ දවසින් පැය කිහිපයක් පමණි. එලෙසින් පාරු පාලම විවෘත කරණතෙක් ගැල්කරුවෝ සහ මිනිසුන් විශාල පිරිසක් මෙගොඩ ඉවුරට වී බලා සිටීම එකල සුලබ සිද්ධියකි. එලෙසින් පාරු පාලම විවෘත කරන තෙක් බලා සිටි ඒ ඔස්සේ එහා මෙහා යන්නට බලා සිටි මිනිසුන් රැඳී සිටි සහ ඒ හරහා ප්‍රවාහනය කරන ලද බඩු භාණ්ඩ සහ උපකරණ ගොඩ ගසා තැබූ මහා විසාල වතු ප්‍රදේශය පසු කාලීනව මහවත්ත වූ බවට පැරැන්නන් පවසයි. එසේම පූර්ව යටත් විජිත සමයේ සිට ප්‍රභූවරයෙකුට අයත්ව තිබූ විශාල නින්දගමක ඉතිරිව තිබූ එක් විශාල වත්තක් මෙය වූ බැවින් එය මහවත්ත ලෙසින් කටවහරයෙන් වර්තමානය දක්වා පැවත ආ බවටත් ජනතාව අතර විශ්වාසයක් පවතී. |


ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොළඹ
ග්‍රාම නිලධාරි වසම් අනුව
උතුරු කොළඹ
මැද කොළඹ
1. සම්මන්ත්‍රණපුර
2. මට්ටක්කුලිය
3. මෝදර
4. මාදම්පිටිය
5. මහවත්ත
6. අලුත් මාවත
7. ලුනු පොකුණ
8. බ්ලූමැන්ඩල්
9. කොටහේන නැගෙනහිර
10. කොටහේන බටහිර
11. කොච්චිකඩේ උතුර
12. ජින්තුපිටිය
13. මසංගස්වීදිය
14. නිව් බසාර්
15. ග්‍රෑන්ඩ්පාස් දකුණ
16. ග්‍රෑන්ඩ්පාස් උතුර
17. නවගම්පුර
18. නැගෙනහිර මාලිගාවත්ත
19. කෙත්තාරාම
20. අළුත්කඩේ නැගෙනහිර
21. අළුත්කඩේ බටහිර
22. කොච්චිකඩේ දකුණ
23. පිටකොටුව
24. කොටුව
25. ගාලු මුවදොර
26. කොම්පඤ්ඤවීදිය
27. හුණුපිටිය
28. සුදුවැල්ල
29. කෙසෙල්වත්ත
30. පංචිකාවත්ත
31. මාලිගාවත්ත බටහිර
32. මාලිගාකන්ද
33. මරදාන
34. ඉබ්බන්වල
35. වේකන්ද

# භෞතික පසුබිම

## 2.1 භූ විෂමතාවය

- කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉතා ඉහළ ජන ඝනත්වයක් සහිත බැවින් සම්පූර්ණ භූමි ප්‍රදේශයම ජනාවාස වී ඇත. එබැවින් මෙම ප්‍රදේශයේ ආර්ථික වටිනාකමක් සහිත ද්‍රව්‍ය හඳුනාගත නොහැක.

## 2.2 ජලවහන රටාව

- මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සමස්ත වශයෙන් ගත් විට ප්‍රදේශය පුරා ව්‍යාප්තව තිබෙන ජලවහන රටාවක් දැකිය හැකිය. එබැවින් කැපී පෙනෙන භූ විෂමතා දක්නට නැත.

## 2.3 පස පිළිබඳ සිතියම

- පාෂාණ පිළිබඳ සිතියම පහත දක්වා ඇත.

## 2.4 ඛනිජ සම්පත්

- කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉතා ඉහළ ජන ඝනත්වයක් සහිත බැවින් සම්පූර්ණ භූමි ප්‍රදේශයම ජනාවාස වී ඇත. එබැවින් මෙම ප්‍රදේශයේ ආර්ථික වටිනාකමක් සහිත ද්‍රව්‍ය හඳුනාගත නොහැක.


## 2.5 දේශගුණය

- කොළඹ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ නිවර්තන මෝසම් දේශගුණික කලාපයට අයත් වේ. වසර පුරාම උණුසුම් කාලගුණයක් පවතී. අප්‍රේල් සිට ජූනි දක්වා සහ සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා නිරිත දිග සහ ඊසාන දිග මෝසම් වර්ෂාපතනය ලැබෙන බැවින් උෂ්ණත්වය අඩු වුවද බොහෝ විට කැළණි ගඟ ආශ්‍රිත ජනතාව ගංවතුර තර්ජනයට ගොදුරු වෙති.

## 2.6 ස්වභාවික වෘක්ෂලතා


මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාලව ස්භාවික වෘක්ෂලතා නොමැත.


## පාෂාණ පිළිබඳ සිතියම



## 2.7 ඉඩම් පරිහරණය සිතියම

.




Map of Colombo City
Size of Population by Grama Niladhari Division, 2001
Population
Less than 10,000
10,000 - 14,999
15,000 - 19,999
20,000 - 24,999
25,000 and above
DS Division Boundary
GN Division Boundary
Colombo D.S. Division
G.N. Divisions
C1 Sammanthranapura
C2 Mattakkuliya
C3 Modara
C4 Madampitiya
C5 Mahawatta
C6 Aluthmawatha
C7 Lonupokuna
C8 Bloemendhal
C9 Kotahena East
C10 Kotahena West
C11 Kochchikade North
C12 Jinthupitiya
C13 Masangasweediya
C14 New Bazaar
C15 Grandpass South
C16 Grandpass North
C17 Nawagampura
C18 Maligawatta East
C19 Kettarama
C20 Aluthkade East
C21 Aluthkade West
C22 Kochchikade South
C23 Pettah
C24 Fort
C25 Galle Face
C26 Slave Island
C27 Hunupitiya
C28 Suduwella
C29 Keselwatta
C30 Panchikawatta
C31 Maligawatta West
C32 Maligakanda
C33 Maradana
C34 Ibbanwala
C35 Wekanda
Thimbirigasyaya D.S. Division
G.N. Divisions
T1 Kollupitiya
T2 Bambalapitiya
T3 Kurunduwatta
T4 Kuppiyawatta West
T5 Kuppiyawatta East
T6 Dematagoda
T7 Wanathamulla
T8 Borella North
T9 Borella South
T10 Gothamipura
T11 Narahenpita
T12 Thimbirigasyaya
T13 Milagiriya
T14 Havelock Town
T15 Kirula
T16 Kirilapone
T17 Wellawatta North
T18 Wellawatta South
T19 Pamankada West
T20 Pamankada East
N